කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

கறுவா அபிவிருத்தி திணைக்களம்

DEPARTMENT OF CINNAMON DEVELOPMENT

2024

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்று அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය: 337

අන්තර්ගතය

- පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය
- පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම
- පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය
- පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක
- පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
- පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ
- පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ලොව පුරා ප්‍රචලිත කිරීමට දායක වූ බෝගයක් වේ නම් එය අන් කවරක් හෝ නොව කුරුඳු බව අවිවාදිත ය. සියවස් ගණනාවක් තිස්සේ ලංකා කුරුඳු සඳහා ලොව පුරා පැවති ඉල්ලුම හේතුවෙන් බොහෝ විදේශීය ජාතීන් මෙරටට ඇදී ආ අතර 16 වන සියවසේ සිට සියවස් පහකට ආසන්න කාලයක් අර්ධ වශයෙන් සහ පූර්ණ වශයෙන් මෙරට බටහිර රටවල යටත් විජිතයක්ව පැවතීමට ද මෙම බෝගය ප්‍රධානතම හේතුවක් විය. පෘතුග්‍රීසි පාලන සමයේ ලංකා කුරුඳු නිෂ්පාදනය ක්‍රමවත් කිරීම සඳහා පළමු වරට කුරුඳු දෙපාර්තමේන්තුවක් ද පිහිටුවන ලද අතර ශ්‍රී ලංකාවේ බෝගයක් වෙනුවෙන් පිහිටුවන ලද පළමු රාජ්‍ය ආයතනය ලෙස මෙය හඳුන්වා දිය හැක. ඉන් අනතුරුව ලන්දේසි යුගයේ දී මෙම දෙපාර්තමේන්තුව වඩාත් විධිමත්ව පවත්වාගෙන යාමට ද කටයුතු කරන ලද අතර පළමු වරට ශ්‍රී ලංකාවේ වාණිජව කුරුඳු වගා කර අස්වැන්න ලබා ගැනීම ආරම්භ කරන ලද්දේ ලන්දේසීන් විසිනි.

ඉංග්‍රීසි පාලන සමයේ දී ලංකා කුරුඳු සඳහා තිබූ රාජ්‍ය ප්‍රමුඛතාව කෝපි, තේ සහ රබර් වැනි වැවිලි බෝග වෙත යොමු වූ අතර මීල අධික ලංකා කුරුඳු වලට මීල අඩු ආදේශකයක් ලෙස කැෂියා කුරුඳු ලෝක වෙළඳපළ තුළ ඉස්මතු වන්නට විය. එසේම ලංකා කුරුඳු වෙනත් විදේශීය රටවල්වල වගා කිරීම මගින් ලංකා කුරුඳුවල ඒකාධිකාරය බිඳ දැමීමට ද ඉංග්‍රීසින් විසින් උත්සාහ දරන ලදී.

කුරුඳු බෝගය සම්බන්ධයෙන් නැවතත් ශ්‍රී ලංකාවේ අවධානය යොමුවීම ආරම්භ වන්නේ නිදහස ලබා දශකයක් පමණ ගතවන විට ය. විශේෂයයෙන් වසර 100 ක පමණ කාලයක් තේ වගාව සඳහා යොදාගනු ලැබූ ඉඩම් ආන්තික නිසරු ඉඩම් බවට ක්‍රමයෙන් පත්වන්නට වීමත් සමග තේ වගාවෙන් ඉවත් වන ඉඩම් සඳහා සුදුසු ක්‍රියාමාර්ග හඳුනාගැනීමට එවකට පැවති රජයන් විසින් කටයුතු කරන ලදී. ඒ අනුව 1968 වසරේ දී පත් කරන්නට යෙදුණු තේ කොමිෂන් සභාවේ 18 වන සැසි වාර්තාව මගින් තේ වගාවෙන් ඉවත්වන ඉඩම්වල කුරුඳු ඇතුලු සුලු අපනයන බෝග වගා කිරීම සුදුසු බවට නිර්දේශ කරනු ලැබ ඇත. ඒ අනුව 1972 වසරේ දී මෙම අරමුණ සපුරාලනු වස් වැවිලි අමාත්‍යාංශය යටතේ සුලු අපනයන බෝග දෙපාර්තමේන්තුව පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් අනුමැතිය ලබා ගන්නා ලදී. 1975 වසරේදී මෙම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට පත් කරන ලද අතර එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ ලෝක ආහාර වැඩසටහන (WFP) මගින් ක්‍රියාත්මක කළ බෝග විවිධාංගීකරණ සංවර්ධන වැඩසටහන සමග ඒකාබද්ධව කටයුතු කරන ලදී.

1992 වසරේ දී පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද අපනයන කෘෂිකර්මාන්ත ප්‍රවර්ධන පනත මගින් දෙපාර්තමේන්තු නාමය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වශයෙන් වෙනස් කරන ලද අතර නව පනත මගින් කුරුඳු ඇතුලු අනෙකුත් අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය සඳහා අවශ්‍යව තිබූ නීතිමය රාමුව සකස් කරනු ලැබීය. මෙම දෙපාර්තමේන්තුව යටතේ වසර 50 කට වැඩි කාලයක් තුළ කුරුඳු වගාවත් එමගින් ලැබූ විදේශ විනිමය ප්‍රමාණයත් විශාල ලෙස ඉහළ ගිය අතර කුරුඳු ශ්‍රී ලංකාවේ සිව්වැනි ප්‍රධාන අපනයන බෝගය දක්වා වර්ධනය වීමට සමත් විය. 2024 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ හෙක්ටාර 37000 ක කුරුඳු වගා වපසරියක් දිස්ත්‍රික්ක 19 ක් පුරා ව්‍යාප්තව පැවති අතර වාර්ෂික නිෂ්පාදනය මෙ.ටොන් 25000 ක් පමණ විය. එම වසරේ කුරුඳු අපනයනයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 226 ක විදේශ විනිමයක් උපයාගෙන ඇත. එසේම 2022 වසරේ දී කුරුඳු සඳහා භූගෝලීය දර්ශක සහතිකය (GI) හිමි වූ අතර ශ්‍රී ලංකාවේ මෙතෙක් මෙම තත්ත්වය හිමිකරගත් එකම නිෂ්පාදනය කුරුඳු වේ. ලංකා කුරුඳු සහ එහි අගය එකතු කළ නිෂ්පාදන සඳහා ඉහළ අපනයන විභවයක් පැවතීමත්, ශ්‍රී ලංකාවටම ආවේණික කර්මාන්තයක් වීමත් හේතුවෙන් කුරුඳු කර්මාන්තය තවදුරටත් සංවර්ධනය කළ යුතු බවත්, ශ්‍රී ලංකාවේ සුලු අපනයන බෝග අතරින් ප්‍රමුඛස්ථානයේ සිටිමින් වැඩිම විදේශීය විනිමයක් ඉපැයීමට දායක වූ කුරුඳු බෝගය වාණිජ වැවිලි බෝගයක් ලෙස ප්‍රවර්ධනය කළ යුතු බවත් හඳුනාගනු ලැබිණ.

ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන්ම වෙන්වූ ආයතනයක් පිහිටුවිය යුතු බවට කුරුඳු කර්මාන්තයේ පාර්ශ්වකරුවන් වෙතින් දීර්ඝ කාලයක් තිස්සේ ඉල්ලීමක් පැවති අතර කුරුඳු ප්‍රධාන වැවිලි බෝගයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණෙන් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම සඳහා 2023 අයවැය යෝජනා අංක 16 ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලැබුණි. ඉන් අනතුරුව 2023 අගෝස්තු මස 14 දින ගරු ජනාධිපතිතුමන් සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/1501/601/050 වූ 2023.08.10 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් 2023. 09. 01 දින සිට කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු ආරම්භ කිරීමටත්, එම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ වැඩිම කුරුඳු වගා ඉඩම් ප්‍රමාණයක් ඇති කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටුවීමටත්, කුරුඳු කර්මාන්තයට අදාළ කටයුතු නියාමනය සඳහා අවශ්‍ය නීතිමය රාමුව සැකසීම වෙනුවෙන් කුරුඳු සංවර්ධන පනත් කෙටුම්පතක් සැකසීමටත් ඉදිරිපත් කර තිබූ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිය. ඒ අනුව දෙපාර්තමේන්තුව පිහිටුවීමේ කටයුතු 2023 සැප්තැම්බර් 01 දින බත්තරමුල්ල සෙත්සිරිපාය පරිශ්‍රයේ දී සිදුවිය. ඉන් අනතුරුව 2023 ඔක්තෝබර් මස සිදු කරන ලද අමාත්‍ය මණ්ඩල සංශෝධනය අනුව කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

දෙපාර්තමේන්තුවේ කටයුතු ආරම්භ කිරීමත් සමග කුරුඳු කර්මාන්තය සඳහා දස අවුරුදු මාර්ග සිතියමක් සියලු පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් සකස් කිරීම ආරම්භ කරන ලද අතර සෑම අංශයක්ම නියෝජනය වන පරිදි අදහස් ලබා ගැනීමෙන් සකස් කරන ලද කුරුඳු සංවර්ධනය සඳහා වන දස අවුරුදු මාර්ග සිතියමේ කෙටුම්පතක් නිකුත් කර ඇත. මෙම මාර්ග සිතියම පදනම් කරගනිමින් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා පස් අවුරුදු උපාය මාර්ගික සැළැස්මක් සකස් කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. කුරුඳු

කර්මාන්තයේ නියාමනය වෙනුවෙන් සකස් කරන ලද කුරුඳු සංවර්ධන පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව මගින් අවසන් කරනු ලැබ ඇති අතර එහි ඉදිරි කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට නියමිතව ඇත. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පැවති මාතර, පලොල්පිටියේ පිහිටි ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සඳහා 2024 ජනවාරි මස 24 වන දින කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/0089/612/008 දරණ සංදේශයට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණ. ඒ අනුව එම ආයතනය ද කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ මේ වන විට ක්‍රියාත්මක වේ. 2024 සැප්තැම්බර් මස දී මෙම දෙපාර්තමේන්තුව පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතට පත් කරන ලද අතර එයින් පසු නව අමාත්‍ය මණ්ඩලය පත් කිරීමත් සමග එම වසරේ නොවැම්බර් මස සිට නැවතත් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශ විෂය පථයට එක් කරන ලදී.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ලංකා කුරුඳු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අපනයන-අභිමුඛ වැවිලි බෝගය ලෙස ස්ථානගත කිරීම.

මෙහෙවර

තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම, තත්ත්ව ප්‍රමිතීන් ඉහළ නැංවීම, වෙළඳපළ් ප්‍රවේශය පුළුල් කිරීම යන උපාය මාර්ගික මූලපිරීම් තුලින් ජාතික ආර්ථිකයට ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ දායකත්වය ශක්තිමත් කිරීම සහ සියලු පාර්ශ්වකරුවන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම.

අරමුණු


2023. 08. 14 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබ අනුමත කරනු ලැබ ඇති අංක 23/1501/601/050 සහ 2023. 08. 10 දිනැති හා 'කුරුඳු සංවර්ධනය සඳහා නව දෙපාර්තමේන්තුවක් පිහිටුවීම' මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ලබා දී ඇති අනුමැතිය පරිදි කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අරමුණු පහත පරිදි වේ.

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ වැවිලි බෝගයක් ලෙස කුරුඳු වගාව සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- අගය එකතු කළ කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය සහ දිරිගැන්වීම.
- කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැලසීම.
- කුරුඳු නිෂ්පාදනවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සහ නිෂ්පාදන විවිධාංගීකරණය සඳහා පාර්ශ්වකරුවන්ට සහාය වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- සුලු පරිමාණ, මධ්‍ය පරිමාණ සහ වැවිලි අංශය තුළ කුරුඳු වගාව ප්‍රවර්ධනය කිරීම.
- කුරුඳු භෝගය සම්බන්ධව භෝග වැඩිදියුණු කිරීම, පාංශු හා ශාක පෝෂක කළමනාකරණය, පසු අස්වනු තාක්ෂණය, ශාක ආරක්ෂණය, වගා කළමනාකරණය සම්බන්ධ බහුවිධ පර්යේෂණ සිදුකිරීම.
- කුරුඳු වගාවේ යහපත් නිෂ්පාදන පිළිවෙත් සහ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.
- කුරුඳු භූගෝලීය දර්ශක සහතිකකරණයට අදාළ විගණනය.
- කුරුඳු නිෂ්පාදන සඳහා අපනයන ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කුරුඳු වගාව සහ එහි පාර්ශ්වකරුවන් සම්බන්ධ දත්ත පද්ධති යාවත්කාලීන කර පවත්වා ගැනීම.
- කුරුඳු වගාව සහ නිෂ්පාදන සම්බන්ධ ව්‍යාප්ති සහ උපදේශන සේවාවන් පවත්වාගෙන යාම.
- කුරුඳු වගාව සහ නිෂ්පාදනයට සම්බන්ධ පාර්ශ්වකරුවන් පුහුණු කිරීම.
- කුරුඳු වගා ආරක්ෂණය සහ පාංශු පෝෂක කළමනාකරණය සම්බන්ධ උපදේශනය.
- කුරුඳු නිෂ්පාදනයට අදාළ විද්‍යාගාර පරීක්ෂණ සේවාවන් පවත්වාගෙන යාම.
- කුරුඳු වගාව ප්‍රවර්ධනයට සම්බන්ධ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පුද්ගලික ආයතන සමග අන්තර් ආයතන සම්බන්ධතා පවත්වා ගැනීම.
- කුරුඳු භෝගයට අදාළ ජාන සම්පත් එක්රැස් කිරීම, සංරක්ෂණය, පවත්වාගෙන යාම සහ ඇගයීම.

1.4 සංවිධාන සටහන


සංවිධාන ව්‍යුහය - කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්
පරිපාලන හා සංවර්ධන අංශය
ඉඩම් අංශය
මූල්‍ය අංශය
සැළසුම් අංශය
ප්‍රා.කා.(පර්.) ඒකාග්‍ර කාර්ය (ජා.කු.පර්.මු.)
ප්‍රා.කා.(පර්යේෂණ) පු.කා.-01
ස.ප./කි.ප.(සංවර්ධන) පු.කා.-02
ගණකාධිකාරී-01
ඇ.විගණක-01
ස.ප./කි.ප. (සැළසුම්)-01
ස.ප./කි.ප.(පර්යේෂණ) (ජා.කු.පර්.මු.)-04
ස.ප./කි.ප. (පාලන)-01
පරි.කි.-01
ඉංජි.කා.-01
ඉංජි.කා.-01
ඉංජි.කා

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1.5.1 කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ :-

i. පර්යේෂණ හා සංවර්ධන අංශය

ii. පාලන අංශය

iii. මූල්‍ය අංශය

iv. සැලසුම් අංශය

v. අභ්‍යන්තර විගණන අංශය

1.5.2 කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවත්නා ආයතන :-

- ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය - පලොල්පිටිය, තිහගොඩ

1.6 අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / පළාත් සභාව යටතේ පවතින ආයතන / අරමුදල්

අදාළ නොවේ.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

අදාළ නොවේ.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

(විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක)

2.1 ප්‍රගතිය

➢ **කුරුඳු ක්ෂේත්‍රයේ 2024.12.31 දිනට ප්‍රගතිය :-**





විස්තරය	වාර්ෂික ඉලක්කය 2024	ප්‍රගතිය 2023.12.31 දිනට	ප්‍රගතිය 2024.12.31 දිනට
කුරුඳු නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)	25,000	24,500	24,900
අපනයන ආදායම (රු.මිලි.)	73,800	70,063.92	67,982.41
අපනයන ආදායම (ඇ.ඩො.මිලි.)	225	214	226
අපනයන ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)	20,500	20,133	19,333
කුරුඳුවල සාමාන්‍ය අලෙවි මිල (රු. / කි.ග්‍රෑ.)	රු.3,400	රු.3,000	රු.3,600

➢ **කුරුඳු නිෂ්පාදනයේ වර්ගීකරණය :-**

නිෂ්පාදන වර්ගය	ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා (මෙ.ටො.)	
	2023	**2024**
කුරුඳු පොතු ආශ්‍රිත නිෂ්පාදන (මෙට්‍රික් ටොන්)	19,676	19,546
කුරුඳු වියළි කොළ (මෙට්‍රික් ටොන්)	251	124
කුරුඳු කොළ තෙල් (මෙට්‍රික් ටොන්)	198	241
කුරුඳු පොතු තෙල් (මෙට්‍රික් ටොන්)	6.68	21.13
එකතුව (මෙට්‍රික් ටොන්)	**20,131.68**	**19,932.13**

(මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.)

➢ 2024 අයවැය ප්‍රතිපාදන - ප්‍රගතිය

විස්තරය	අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.)	මුලු ශුද්ධ ප්‍රතිපාදනය (රු.)	වියදම (2024.12.31 දිනට) (රු.)	අතැති බිල්
පුනරාවර්තන				
පුද්ගල පඩිනඩි	77,000,000.00	73,000,000.00	63,691,105.73	-
වෙනත් පුනරාවර්තන වියදම්	48,000,000.00	39,000,000.00	20,603,186.14	-
උප එකතුව	**125,000,000.00**	**112,000,000.00**	**84,294,291.87**	-
ප්‍රාග්ධන				
සිනමන් ගේට් ව්‍යාපෘතිය	-	70,000,000.00	46,510,830.93	-
ආයතනික ප්‍රාග්ධන වියදම්	15,000,000.00	32,000,000.00	22,833,391.35	-
උප එකතුව	**15,000,000.00**	**102,000,000.00**	**69,344,222.28**	-
මුළු එකතුව	**140,000,000.00**	**214,000,000.00**	**153,638,514.15**	**-**

➢ 2024 වර්ෂයේ අයවැයෙන් ප්‍රතිපාදන වෙන්වන මූලධන වැය විෂයයන් වලට අදාළ 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

වැය විෂය අංකය	වැය විස්තරය	අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.)	මුලු ශුද්ධ ප්‍රතිපාදනය (රු.)	2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.)	2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (%)
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම				
2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම	5,000,000.00	5,000,000.00	2,562,491.37	51%
2002	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2,000,000.00	2,000,000.00	63,540.00	3%
2003	වාහන	3,000,000.00	3,000,000.00	335,910.00	11%
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම				
2102	ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	1,000,000.00	18,800,000.00	18,781,575.98	99.9%
2103	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	500,000.00	500,000.00	500,000.00	100%
2104	ගොඩනැගිලි සහ ඉදිකිරීම් (සිනමන් ගේට්)	-	70,000,000.00	46,510,830.93	66%
2105	ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම	1,000,000.00	1,000,000.00	169,259.00	17%
2106	මෘදුකාංග සංවර්ධනය	2,000,000.00	1,200,000.00	200,000.00	17%
	හැකියා වර්ධනය				
2401	කාර්ය මණ්ඩල පුහුණු	500,000.00	500,000.00	220,615.00	44%
	එකතුව	15,000,000.00	102,000,000.00	69,344,222.28	68%

➢ සංවර්ධන වැඩසටහන් ප්‍රගතිය

❖ ලංකා සත්‍ය කුරුඳු නහා සිටුවීම සඳහා වන බහු දිශා ප්‍රවේශය.

2024 වසරේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය ලෙස කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රුපියල් 57,869,540 ක වටිනාකමකින් යුත් සංවර්ධන කටයුතු සාර්ථකව සිදු කරන ලදී. ඉන් රුපියල් මිලියන 35 ක් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය මගින් කෘෂි අංශ නවීකරණ වැඩසටහන යටතේ ලබා දී ඇති අතර එම මුදලින් රුපියල් 31,759,415.00 ක මුදලක් වියදම් වූ අතර රුපියල් 26,110,500 ක දායකත්වයක් පාර්ශවකරුවන් විසින් ලබා දී ඇත. ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් ඔස්සේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ඉලක්කගත නවීකරණය කිරීමේ මැදිහත්වීම් තුළින් ලංකා කුරුඳු වල ඵලදායිතාව, ගුණාත්මකභාවය සහ ගෝලීය තරඟකාරිත්වය ඉහළ නැංවීම කෙරෙහි උපායමාර්ගික අවධානය යොමු කිරීම මෙහි ප්‍රධාන ප්‍රයත්නය විය.

අනු අංකය	ක්‍රියාකාරකම	මූල්‍ය ඉලක්ක (රු. මි.)	මූල්‍ය ප්‍රගතිය (රු. මි.)	භෞතික ඉලක්ක 2024	භෞතික ප්‍රගතිය 2024
1	කුරුඳු ඉඩම්වල ඵලදායිතාව වැඩි දියුණු කිරීම	30	29.14	මුළු පැළ සංඛ්‍යාව – 1,006,000 පාංශු pH පරීක්ෂණ පැවැත්වීම - 1,000 ඵලදායිතාව වැඩි දියුණු කිරීම පිළිබඳ දැනුවත් කිරීම - 15	මුළු පැළ සංඛ්‍යාව – 1,006,970 ජම්බෝ පැළ – 401,020 කුඩා ප්‍රමාණයේ පැළ - 605,950 හෙක්ටයාර ගණන – 698.83 පාංශු pH පරීක්ෂණ ගණන – 1,000 ඵලදායිතාව වැඩි දියුණු කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් - 12
2	නව සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සහ දැනට පවතින සැකසුම් මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම	3.65	2.095	නව සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම – 2 පවතින මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම – 3 යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලදී ගැනීම – 4	නව සැකසුම් පහසුකම් ස්ථාපිත කිරීම – 3 යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලදී ගැනීම – 4
3	තත්ත්ව පාලන සහතිකකිරීම	-	-	GAP සහ GI සහතික - 75	GAP සහ GI සහතික - 75
4	ධාරිතා සංවර්ධනය	1	0.185	ගොවි පුහුණු වැඩසටහන්-100 ක්ෂේත්‍ර දින වැඩසටහන්-10 සම්මන්ත්‍රණ හා වැඩමුළු - 5	ගොවි පුහුණු වැඩසටහන් – 100 ක්ෂේත්‍ර දින වැඩසටහන් – 12 සම්මන්ත්‍රණ හා වැඩමුළු – 2
5	පරිපාලන වියදම්	0.35	0.339		
	මුළු වෙන් කිරීම	**35**	**31.759**		

- **<u>කුරුඳු ඉඩම්වල ඵලදායිතා වැඩිදියුණු කිරීම</u>**

2024 වසරේ දී කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව සිය සමාරම්භක සංවර්ධන කටයුතුවල කොටසක් ලෙස දැනට පවතින කුරුඳු වගාවන්හි ඵලදායිතාව සහ තිරසාරභාවය ඉහළ නැංවීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් කුරුඳු ඉඩම්වල ඵලදායිතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ ප්‍රධාන මුලපිරීමක් වූයේ පැළ නිෂ්පාදන වැඩසටහන වන අතර එය උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය සැපයීම තුළින් ඵලදායිතාවයේ ගැටළු විසඳීමට කටයුතු කරන ලදී. දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පෞද්ගලික පැළ තවාන් 497 ක ධාරිතාව උපයෝගී කර ගනිමින් මෙම වැඩසටහන මගින් කුරුඳු පැළ 1,006,970 ක් සාර්ථකව නිකුත් කරන ලද අතර එමඟින් හෙක්ටයාර 698.83 ක් ඵලදායිතාවය ප්‍රවර්ධනය කිරීමට හැකි විය. කෑගල්ල, කුරුණෑගල, කළුතර, ගම්පහ, ගාල්ල, රත්නපුර, මාතර, මහනුවර සහ හම්බන්තොට ඇතුළු කුරුඳු වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්කවලට ප්‍රමුඛත්වය ලබා දුන් අතර එහිදී කුරුඳු සංවර්ධන නිලධාරීන් හට ක්ෂේත්‍ර මට්ටමේ තාක්ෂණික මග පෙන්වීම සහ සහාය ලබා දීම සඳහා උපායමාර්ගිකව අනුයුක්ත කරන ලදී. දෙපාර්තමේන්තු ක්‍රියාකාරිත්වයේ පළමු වසර තුළ ඇති සීමිත සම්පත් සැළකිල්ලට ගනිමින්, ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සහතික කිරීම සඳහා මෙම වැඩසටහන මෙම දිස්ත්‍රික්ක කෙරෙහි පමණක් අවධානය යොමු කරන ලදී.

පාළු පැළ සිටුවීමේ වැඩසටහන හරහා, භූමි ඵලදායිතාවය ප්‍රශස්ත කිරීම සඳහා අඩු ඵලදායිතාවයක් සහිත ඉඩම් ඉලක්ක කරන ලදී. නැවත වගා කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම අවශ්‍ය වන දැනට පවතින කුරුඳු ඉඩම් ක්‍රමානුකූලව හඳුනා ගැනීමෙන්, පවතින සම්පත් කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීම මෙම වැඩසටහන හරහා සහතික කරන ලදී. පාළු සිටුවීම සඳහා උසස් තත්ත්වයේ පැළ සැපයීම හරහා අස්වැන්න වැඩි කිරීම පමණක් නොව කුරුඳු වගාවේ සමස්ත ලාභදායීතාවය ශක්තිමත් කරන ලදී. දැනට පවතින ඉඩම්වල ඵලදායිතා වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, මෙම වැඩසටහන කර්මාන්තයේ තිරසාර වර්ධනයට දායක වන අතර ලංකා කුරුඳු වලට වැඩි ගෝලීය තරඟකාරීත්වයක් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

- **<u>නව සැකසුම් පහසුකම් ස්ථාපිත කිරීම සහ දැනට පවතින සැකසුම් පහසුකම් වැඩිදියුණු කිරීම</u>**

2024 වසරේදී කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ කුරුඳු සැකසීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ යාන්ත්‍රීකරණයට සහාය වීම සඳහා පසු අස්වනු තාක්ෂණ හා අගය එකතු කිරීමේ සංවර්ධන වැඩසටහන යටතේ ඉලක්කගත වැඩපිළිවෙළක් දියත් කරන ලදී. ඉහළ වටිනාකමකින් යුත් වෙළෙඳපොළ සඳහා අවශ්‍ය තත්ත්ව ප්‍රමිතීන් සපුරාලීම සඳහා කුඩා පරිමාණ, ගෘහස්ථ මට්ටමින් කුරුඳු සැකසුම් හරහා මතුවන අභියෝග හඳුනාගනිමින් කුරුඳු සැකසීමේ ප්‍රමිතීන් ඉහළ නැංවීම සහ ක්ෂේත්‍රය තුළ අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ විය. මෙම වැඩසටහන යටතේ නව කුරුඳු සැකසුම් ඒකක තුනක් පිහිටුවීම සඳහා ආයෝජන ආධාර ලබා දෙන ලදී. මෙම පහසුකම් වඩා හොඳ යටිතල පහසුකම් සහ උපකරණ හඳුන්වා දීම, වැඩි දියුණු කරන ලද සැකසුම් භාවිතයන් සහ උසස් තත්ත්වයේ නිමැවුම් සහතික කිරීම සඳහා නිර්මාණය කරන ලදී. මීට අමතරව, කුරුඳු සැකසීම සහ අගය එකතු කිරීම සම්බන්ධ යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීම සඳහා ආයෝජන ආධාර හතරක් ප්‍රදානය කරන ලද අතර, මෙම අංශය තවදුරටත් නවීකරණය කරන ලදී.

කුඩා හා මධ්‍ය පරිමාණ පාර්ශවකරුවන් ගුණාත්මකව කුරුඳු සැකසීමේ ක්‍රම අනුගමනය කිරීමට දිරිගැන්වීමට මෙම ආයෝජනය ඉවහල් වූ අතර එමඟින් නිෂ්පාදන ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම පමණක් නොව වැඩි ආදායමක් උත්පාදනයටද ඉවහල් විය.

ලංකා කුරුඳුවල තරඟකාරිත්වය සහ ලාභදායිතාව ඉහළ නැංවීම සඳහා ප්‍රධාන අංශයක් ලෙස අගය එකතු කිරීම කෙරෙහි සැළකිය යුතු අවධානයක් යොමු කරන ලදී. දැනට, ශ්‍රී ලංකාවේ කුරුඳු අගය එකතු කිරීමේ ප්‍රතිශතය 5% කට වඩා අඩු මට්ටමක පවතින නමුත්, මෙම ක්ෂේත්‍රයේ සැළකිය යුත විභවයක් ඉස්මතු වී ඇත. අගය එකතු කිරීමේ යන්ත්‍රසූත්‍ර සඳහා ආයෝජන ආධාර ලබා දීමෙන්, කුරුඳු තෙල්, කුරුඳු කුඩු සහ වෙනත් ඉහළ පෙළේ ව්‍යුත්පන්නයන් ඇතුළු ඔවුන්ගේ නිෂ්පාදන පිරිනැමීම විවිධාංගීකරණය කිරීමට මෙම වැඩසටහන පාර්ශවකරුවන් දිරිමත් කරන ලදී. මෙම ප්‍රවේශය කුරුඳුවල ආර්ථික වටිනාකම වැඩි කරනවා පමණක් නොව, උසස් තත්ත්වයේ, සැකසූ නිෂ්පාදන සඳහා ගෝලීය වෙළඳපොළ ඉල්ලීම් සමඟ පෙළ ගැසෙයි. නවීකරණය කරන ලද කුරුඳු සැකසුම් ඒකක සංවර්ධනය කිරීම ඉහළපෙළේ ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමේ ශ්‍රී ලංකාවේ අභිලාෂය සාක්ෂාත් කර ගැනීම සඳහා ඉතා වැදගත් වේ. ගුණාත්මක ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සහ අගය එකතු කිරීම මගින් කුරුඳු ක්ෂේත්‍රය ගෝලීය වශයෙන් තරඟකාරී හා තිරසාර කර්මාන්තයක් බවට පරිවර්තනය කිරීම සඳහා අඩිතාලම දැමීම, ලංකා කුරුඳු ප්‍රමුඛතම අපනයනකරු ලෙස රටේ කීර්තිනාමය තවදුරටත් ශක්තිමත් කිරීම මෙම වැඩසටහන මගින් සිදු කරන ලදී.

- **<u>ධාරිතා සංවර්ධනය සහ පුහුණු වැඩසටහන්</u>**

2024 දී කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව කුරුඳු කර්මාන්තයේ පාර්ශවකරුවන්ගේ කුසලතා සහ විශේෂඥ දැනුම වැඩි දියුණු කිරීම සඳහා ධාරිතා සංවර්ධනය සහ දැනුම බෙදා හැරීම කෙරෙහි සැළකිය යුතු අවධානයක් යොමු කළේය. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් හරහා ලංකා කුරුඳු කර්මාන්තයේ තිරසාර වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන නවීන ක්‍රමවේදයන් අනුගමනය කිරීම, ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ ගුණාත්මක භාවයේ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා ගොවීන්, සැකසුම්කරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් සවිබල ගැන්වීම දෙපාර්තමේන්තුවේ අරමුණ විය.

- **<u>ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන්</u>**

මාතර ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය විශේෂිත පුහුණුවක් ලබා දීමේ දී කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කරන ලදී. පුහුණු වැඩසටහන් 42 ක් පවත්වන ලද අතර, පහත ප්‍රධාන මාතෘකා කිහිපයක් ආවරණය විය.

- ✓ **කුරුඳු සැකසුම් පුහුණුව:**
  කාර්යක්ෂමතාව සහ නිෂ්පාදන ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා උසස් ලෙස කුරුඳු සැකසීමේ ශිල්පීය ක්‍රම පිළිබඳව සහභාගිවන්නන් සන්නද්ධ කිරීම.

- ✓ **අගය එකතු කිරීම සහ සැකසීම:**
  උසස් තත්ත්වයෙන් කුරුඳු සැකසීම සහ නිෂ්පාදන විවිධාංගීකරණය තුළින් කුරුඳු වල වටිනාකම ඉහළ නැංවීම සඳහා නවෝත්පාදන ක්‍රමවේදයන් කෙරෙහි අවධානය යොමු කිරීම.

- ✓ **යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) යටතේ කුරුඳු ඉඩම් කළමනාකරණය:**
  අස්වැන්න වැඩි දියුණු කිරීම සහ පාංශු සෞඛ්‍ය ආරක්ෂා කිරීම සඳහා නිරසාර ගොවිතැන් පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.

- ✓ **කුරුඳු කොළ තෙල් ආසවනය කිරීමේ ශිල්පීය ක්‍රම:**
  වටිනා අතුරු නිෂ්පාදනයක් වන උසස් තත්ත්වයේ කුරුඳු තෙල් නිස්සාරණය කිරීම සඳහා පුහුණුව ලබා දීම.

- ✓ **තවාන් කළමනාකරණය:**
  ගුණාත්මක හා උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය ලබාදීම සහතික කිරීම සඳහා කුරුඳු තවාන් කළමනාකරණය සඳහා සහභාගිවන්නන් පුහුණු කිරීම.

මෙම පුහුණු සැසි මගින් ගොවීන්, සැකසුම්කරුවන් සහ කර්මාන්ත පාර්ශවකරුවන් ඇතුළු ව සහභාගිවන්නන් 953 දෙනෙකුට ප්‍රතිලාභ ලැබුණි. ප්‍රායෝගික නිපුණතා සහ තාක්ෂණික දැනුම ලබා දීමෙන්, ගෝලීය කුරුඳු වෙළඳපොළෙහි වර්ධනය වන ඉල්ලීම් සපුරාලීමට හැකි දක්ෂ ශ්‍රම බලකායක් ගොඩනැගීම මෙම වැඩසටහන්වල අරමුණ විය.

- **<u>දිස්ත්‍රික් මට්ටමේ ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩසටහන්</u>**

දිස්ත්‍රික් මට්ටමින්, ගොවීන් සහ පාර්ශවකරුවන් සඳහා දේශීය පුහුණු අවස්ථා ලබා දීම සඳහා දෙපාර්තමේන්තුව පුළුල් ධාරිතා සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන තුළින්;

- ✓ ගොවි පුහුණු වැඩසටහන් 100: කුරුඳු වගාව, පළිබෝධ හා රෝග කළමනාකරණය සහ පසු අස්වනු හැසිරවීම සම්බන්ධ විවිධ මාතෘකා ආවරණය කිරීම.
- ✓ ක්ෂේත්‍ර දින 12: උචිත භාවිතයන් සහ නවෝත්පාදන ශිල්පීය ක්‍රම ප්‍රදර්ශනය කිරීම සඳහා කුරුඳු ක්ෂේත්‍රවල පවත්වන ලද අත්හදා බැලීම් පිළිබඳ දැනුවත් කිරීම.
- ✓ වැඩමුළු 2: කුරුඳු ක්ෂේත්‍රයේ අගය එකතු කිරීම, වෙළඳපොළ ප්‍රවේශය සහ තිරසාරභාවය වැනි උපායමාර්ගික මාතෘකා කෙරෙහි අවධානය යොමු කිරීම සිදු විය.

මෙම දිස්ත්‍රික් මට්ටමේ මූලපිරීම් හරහා ප්‍රජා මට්ටමේ දැනුවත්භාවය වර්ධනය කිරීමට සහ වැඩිදියුණු කළ පිළිවෙත් අනුගමනය කිරීම දිරිමත් කිරීමට හැකි විය.





රාජ්‍ය / පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ කුරුඳු සැකසුම් උපකරණ ලබා දීම









ක්ෂේත්‍ර දින
වැඩසටහන් / පුහුණු
වැඩසටහන්





පවතින කුරුඳු වගාවන්හි ඵලදායීතාවය නංවාලීම සඳහා ආයෝජන සහාය යටතේ උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය ලබා දීම.





❖ ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය

කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය මූලිකවම නිෂ්පාදනය හා ඵලදායීතාව ඉහළ නැංවීම, කුරුඳු පදනම් කරගත් නිෂ්පාදන වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ නව්‍ය සහ ස්ථායිත්වය සහිත නව නිෂ්පාදන සංවර්ධනය, උසස් ගුණාත්මක තත්ත්වයේ ප්‍රභේද සංවර්ධනය, පස හා ශාක පෝෂණ කළමනාකරණය සහ පරිසර හිතකාමී කෘමි හා රෝග කළමනාකරණය හරහා පරිසර හිතකාමී ක්‍රමයන් අනුගමනය කරමින් ක්ෂේත්‍රයේ අවශ්‍යතාවට අනුකූල සහ දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුගත වෙමින් විදේශ විනිමය ප්‍රවාහය උපරිම කිරීම සඳහා ක්‍රියා කරයි. මෙම අරමුණ ළඟා කර ගැනීම වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ එකම පර්යේෂණ මධ්‍යස්ථානය වන තිහගොඩ පිහිටා ඇති ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වෙයි.

පර්යේෂණ වැඩසටහන

ශෂ්‍ය විද්‍යා හා බෝග වැඩි දියුණු කිරීම, පාංශු හා ශාක පෝෂණ, ශාක ආරක්ෂණ සහ පසු අස්වනු තාක්ෂණ යන පර්යේෂණ විද්‍යාගාර මඟින් 2024 වසරේදී තම අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අදාළ පර්යේෂණ ව්‍යාපෘති 43 ක් සිදු කර ඇත. කුරුඳු පිළිබඳව පවතින විද්‍යාත්මක දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් සිදුකර ඇති එම ඇතැම් ව්‍යාපෘති දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සමඟ අනුබද්ධව ක්‍රියාත්මක කර ඇත. ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයෙහි (NCRTC) මඟින් දේශීය විශ්වවිද්‍යාලවල පර්යේෂණ ශිෂ්‍යයන් 14 දෙනෙකු 2024 වර්ෂය තුලදී අධීක්ෂණය කර ඇත.

ආයතනය මඟින් පහත ක්ෂේත්‍රයන් යටතේ පර්යේෂණ ව්‍යාපෘතීන් සිදු කරනු ලබයි.

- නව කුරුඳු ප්‍රභේද අභිජනනය කිරීම
- තවාන් පාලනය පිළිබඳව සහ කුරුඳු බෝගයේ ශෂ්‍ය විද්‍යාව පිළිබඳ පර්යේෂණ කටයුතු
- ශ්‍රී ලංකාවේ විශාලතම සහ ප්‍රමුඛතම කුරුඳු ජාන සම්පත් එකතුව පවත්වාගෙන යාම
- ‘ශ්‍රී ගැමුණු’ සහ ‘ශ්‍රී විජය’ නව කුරුඳු ප්‍රභේද පැල නිෂ්පාදනය
- කුරුඳු වගාවට අදාළ සියලු පාංශු විද්‍යාත්මක පර්යේෂණ ව්‍යාපෘති
- නව පොහොර වර්ග සහ කාබනික කුරුඳු වගාවට නිර්දේශ
- කුරුඳු ඉඩම් පරීක්ෂාව සහ පාංශු තත්ත්වයන් පිළිබඳ නිර්දේශ
- පස් සහ පොහොර සාම්පල පරීක්ෂා කර වාර්තා ලබා දීම
- වගාවට හානි කරන පළිබෝධ සහ රෝග පිළිබඳ පර්යේෂණ
- ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කිරීම
- නව පළිබෝධ මර්ධන නිර්දේශ
- රෝග සහ පළිබෝධ හඳුනාගැනීම සහ වාර්තා සැපයීම
- නිවැරදි තාක්ෂණයෙන් යුතුව අස්වනු ලබා ගැනීම
- අස්වැන්න සකස් කිරීම, ගබඩා කිරීම, අගය එකතු කළ නිෂ්පාදන
- තෙල් වර්ග නිස්සාරණය, අපනයනය සඳහා ප්‍රමිතීන් සහ සහතිකකරණය
- ISO 17025:2018 ප්‍රතිතනය සහිත විද්‍යාගාරයෙන් කුරුඳු සහ එහි නිෂ්පාදන වල ප්‍රමිතියට අදාල පරාමිතීන් සහ කුරුඳු තෙල් සංඝටක විශ්ලේෂණය

2024 වර්ෂයේදී අවසන් කරන ලද පර්යේෂණ කිහිපයක ප්‍රතිඵල පහත පරිදි වේ.

- 2024 වර්ෂයේ මාතර දිස්ත්‍රික්කයේ කුරුඳු තෙල් ආසවන ඒකක අතහැර දැමීම පිළිබඳව සිදු කරන ලද පුළුල් සමීක්ෂණයකින් හෙළි වූයේ, පරීක්ෂා කරන ලද ඒකක වලින් 61.7% ක්ම ප්‍රධාන වශයෙන් ආර්ථික සාධක හේතුවෙන් අතහැර දමා ඇති බවයි. මෙම අධ්‍යයනය මගින් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, තාක්ෂණික යාවත්කාලීන කිරීම්, ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සහ වෙළඳපොළ සංවර්ධන මූලපිරීම් මඟින් දිගුකාලීන ශක්‍යතා සහිතව කුරුඳු තෙල් කර්මාන්තය පුනර්ජීවනය කරා ගෙන යාම සඳහා තිරසාර ක්‍රියාමාර්ග ඇතුළු පුනර්ජීවන උපාය මාර්ග යෝජනා කරන ලදී.
- අස්වැන්න නෙළීමට පෙර කුරුඳු පඳුරු සඳහා යූරියා ග්‍රෑම් 50 ක් යෙදීම මඟින්, පොතු ඉවත් කිරීමේ හැකියාව, නැවුම් පොතු බර, වියළි පොතු බර, කඳ උස, කඳ බර සහ පොතු ඝණකම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොකරයි.
- කුරුඳු පැල සිටුවීමේ වළවල් සකස් කිරීම ද ඇගයීමට ලක් කරන ලද අතර, එහි ප්‍රතිඵලවලින් හෙළි වූයේ, යාන්ත්‍රික පස් විදුම් යන්ත්‍රය භාවිතයෙන් සකස් කරන ලද සෙන්ටිමීටර 20 (විෂ්කම්භය) x සෙන්ටිමීටර 30 (ගැඹුර) ප්‍රමාණයේ වළවල්, කුරුඳු පැළ වල උසස් පැළ වර්ධනය, මූල වර්ධනය, මුල් පැතිරීම සහ පැල මිය යාමේ අඩු ප්‍රවණතාව සඳහා කැපී පෙනෙන ලාභදායී විකල්පය වන බවයි.
- කෙසෙල් ගෙඩිවල ආයු කාලය දීර්ඝ කිරීම සඳහා කුරුඳු පත්‍ර තෙල් (CLO) සමඟ මිශ්‍ර කරන ලද ගම් අරාබික් (GA) ආහාරයට ගත හැකි ආලේපනයේ බලපෑම විමර්ශනය කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී. ප්‍රතිකාරවලට GA (10%) සහ කුරුඳු පත්‍ර තෙල් සාන්ද්‍රණයන් හතරකින් (1%, 0.5%, 0.25% සහ 0.05%) මිශ්‍ර කිරීම ඇතුළත් විය. බර අඩු වීම, අනුමාපනය කළ හැකි ආම්ලිකතාවය (TA), pH, බ්‍රික්ස්, වර්ණය සහ බ්‍රික්ස්/ආම්ලිකතා අනුපාත විශ්ලේෂණය ඇතුළු භෞතික රසායනික ලක්ෂණ මනිනු ලැබීය. 10% GA සංයුක්ත 0.25% CLO ප්‍රතිකාරය හොඳම ප්‍රතිඵල පෙන්නුම් කළ අතර, කෙසෙල් ගෙඩිවල ගබඩා කාලය දින 15ක් දක්වා දීර්ඝ කිරීම සඳහා මෙම කුරුඳු තෙල් ආශ්‍රිත ආලේපනය ඵලදායී බව තහවුරු විය.
- පැළ මැක්කන්ට එරෙහිව ද්‍රාවකයක් ලෙස ජලය භාවිතා කරමින් නැවුම් සහ වියළි *D. parviflora* ශාක කොටස් නිස්සාරණය කිරීමේ කාර්යක්ෂමතාව තක්සේරු කරන ලදී. සොයාගැනීම්වලින් හෙළි වූයේ D. parviflora හි මූල සාරය සියලුම ප්‍රතිකාර අතර පැළ මැක්කන්ට එරෙහිව ඉහළම කාර්යක්ෂමතාව (LC50 = 0.20) පෙන්නුම් කළ බවයි.
- කුරුඳු රයිසෝස්පියර් පසෙන් වෙන් කොට ගත් හතරක් ඇතුළුව ට්‍රයිකොඩර්මා විශේෂ අටක්, ද්විත්ව වගා විශ්ලේෂණයක් භාවිතා කරමින් සුදු මූල රෝගයේ (*R. microporus*) රෝග කාරකයට එරෙහිව ඒවායේ ප්‍රතිවිරෝධී බලපෑම සඳහා පරීක්ෂා කරන ලදී. MA1 මඟින් රෝග කාරකයේ වර්ධනයේ ඉහළම නිෂේධනය (44.12%) පෙන්නුම් කළ අතර MA2 අඩුම (22.06%) නිෂේධනය පෙන්නුම් කළේය.

සාම්පල පරීක්ෂාව

ප්‍රතිඵලය කල පරීක්ෂණාගාර දෙකක් වන පාංශු විද්‍යා සහ ශාක පෝෂණ විද්‍යාගාරය සහ පසු අස්වනු තාක්ෂණ විද්‍යාගාරය යටතේ, කුරුඳු වගාව ආශ්‍රිත පස, පොහොර සහ කුරුඳු නිෂ්පාදන පිළිබඳව අදාළ බාහිර පාර්ශවයන් වෙත වාර්තා 772 ක් නිකුත් කර ඇත.

වගුව 01 : සාම්පල පරීක්ෂාවන් පිලිබඳ තොරතුරු - 2024

පරීක්ෂාව	සාම්පල ගණන		ඉපයූ අදායම (රු.)
	අභ්‍යන්තර	බාහිර	
පස් සාම්පල			
pH	618	217	16,150.00
EC	618	217	
N	30	0	
P	75	14	
K	31	15	
කුරුඳු සාම්පල			
තෙතමන ප්‍රතිශතය	191	6	
තෙල් ප්‍රතිශතය	239	7	5,250.00
ජල ක්‍රියාකාරිත්වය	315	49	22,050.00
සල්ෆර් ප්‍රමානය	44	11	9,350.00
සම්පූර්ණ අළු ප්‍රමානය	67	6	4,800.00
අම්ල අද්‍රාව්‍ය අළු ප්‍රමානය	69	4	6,000.00
සාපේක්ෂ ඝනත්වය		7	4,200.00
වර්තනාංකය		7	4,900.00
පෙනුම, පැහැය සහ සුවඳ		5	
එතනෝල් හි ද්‍රාව්‍යතාවය		3	1,500.00
ආලෝක විවර්තනය		2	1,400.00
එකතුව (රු.)			**75,600.00**

පුහුණු වැඩසටහන් සහ දැනුම බෙදා හැරීම.

පර්යේෂණ අංශයෙහි නව දැනුම, ගොවීන්, වගාකරුවන්, සැකසුම්කරුවන්, අපනයනකරුවන් සහ අනෙක් පාර්ශවයන් වෙත ලබාදීම සඳහා, 2024 දී, කුරුඳු බීජයේ සිට අගය එක් කළ නිෂ්පාදන දක්වා සියලුම පරාසයන් ආවරණය කරන පුහුණු වැඩසටහන් 42 ක් සංවිධානය කර ඇති අතර, අයදුම්කරුවන් 953 දෙනෙකු පුහුණු කර ඇත. එමෙන්ම, ප්‍රදර්ශන වැඩසටහන් 7 ක් සඳහා ද දායකත්වය සපයා ඇත.

NCRTC හි පර්යේෂණ නිලධාරීන් ප්‍රාදේශීය, ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ පැවැත්වූ පාලන හා ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීමට දායකත්වය ලබා දෙමින් සාකච්ඡා 50 කට වැඩි ගණනකට සම්බන්ධ වී ඇත.

ඊට අමතරව, තොරතුරු සහ උපදෙස් ලබාදීමට 5000 කට වැඩි පිරිසක් දුරකථන මාර්ගයෙන් සම්බන්ධ කරගෙන ඇත. පර්යේෂණ අංශයෙහි දායකත්වයෙන් සකස් කෙරුණු, කුරුඳු වගාව සහ සැකසුම් පිළිබඳව සවිස්තරාත්මක තාක්ෂණික විස්තර අඩංගු කුරුඳු තාක්ෂණික ප්‍රකාශනය, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියෙන් නොමිලේ ලබා ගත හැක.

2024 වර්ෂයේ පළ කරන ලද පර්යේෂණ පත්‍රිකා

1. Azad, R., Jayaprada, T., Ranaweera, S.A., **Ranawaka, R.A.A.K.**, Jayasekara, L., Senanayake, S.G.J.N., Tamura, H. & Geekiyanage, S. (2024) 'Diversity and morpho-chemo correlations of Cinnamon (*Cinnamomum verum* J. Presl) bark oil from Sri Lanka', *Journal of Agriculture and Food Research*, 18, 101500. https://doi.org/10.1016/j.jafr.2024.101500.

2. De Silva, R.S.D., Amarasinghe, S.R. & **Ranawaka, R.A.A.K.** (2024) 'Assessment of phytotoxicity of potable water treatment plant sludge-bound compost pellets on seed germination of radish (*Raphanus sativus* L.)', *Proceedings of International Forestry and Environment Symposium*, February 2024. https://doi.org/10.31357/fesympo.v27.6615.

3. Dilshan, V.G.T., **Wijeweera, A.A.**, Gunathilaka, H.A.W.S. & **Widanapathirana, C.U.** (2024) 'Effect of sulphur fumigation on the quality and shelf-life of cinnamon quills', *Proceedings of 22nd Agricultural Research Symposium (2024)*, pp. 651–655.

4. Kaushalya, S.D.H., **Pabasara, P.K.D.** & Gunathilaka, H.A.W.S. (2024) 'Impact of urea application on selected time intervals before harvesting on peeling ability and bark thickness of cinnamon', *Proceedings of 22nd Agricultural Research Symposium*, Wayamba University of Sri Lanka, pp. 1–5.

5. Kodippili, S.P., **Widanapathirana, C.U.** & Mapa, S.T. (2024) 'Assessment of sulphur fumigation on quality of Ceylon cinnamon (*Cinnamomum zeylanicum* Blume) quills', *International Conference on Innovation and Emerging Technologies 2024*, Faculty of Technology, University of Sri Jayewardenepura, Sri Lanka, pp. 156.

6. Madhushani, R.V.P.T., **Wijeweera, A.A.** & Kariyawasam, K.M.G.M.M. (2024) 'Investigating the physicochemical and organoleptic properties of cinnamon (*Cinnamomum verum*) incorporated cassava (*Manihot esculenta*) cookies', *8th International Research Conference of Uva Wellassa University (IRCUWU2024)*.

7. Prathibhani, M., Azad, R., Ranaweera, S.A., Jayasekara, L., **Ranawaka, R.A.A.K.**, Senanayake, G., Abeynayake, S. & Geekiyanage, S. (2024) 'Variation in plant morphology and leaf essential oil composition of a representative *Cinnamomum verum* collection from Sri Lanka', *Journal of the National Science Foundation of Sri Lanka*, 52(1), pp. 3–16. https://doi.org/10.4038/jnsfsr.v52i1.11086.

8. Prathibhani, M., Azad, R., **Ranawaka, R.A.A.K.**, Senanayake, S.G.J.N., Ranaweera, S.A. & Geekiyanage, S. (2024) 'Vegetative propagation potential of a *Cinnamomum verum* J. Presl collection for distinct leaf oil composition', *International Research Symposium on Traditional Medicine (AyurEx Colombo) – 2024*, Faculty of Graduate Studies, University of Kelaniya.

9. Samaraweera, M.A., **Madhurangi, H.M.T.T.**, Wijekoon, R. & Wasantha Kumara, K.L. (2024) 'In vitro evaluation of *Trichoderma* isolates as biocontrol agents against *Rigidoporus microporus* (Fr.) Overeem causing white root disease in cinnamon', *Proceedings of the International Symposium on Agriculture and Environment 2024*, Faculty of Agriculture, University of Ruhuna, Mapalana, Kamburupitiya, Sri Lanka, p. 160.

10. Sandamini, D., Prathibhani, M., Azad, R., **Ranawaka, R.A.A.K.**, Gunawardhana, K.D.M.S.V.S., Jayasinghe, G.G., Ranaweera, S.A. & Geekiyanage, S. (2024) 'Determination of the vegetative growth performance of selected cinnamon (*Cinnamomum verum* J. Presl) accessions at three locations of Sri Lanka', *International Research Symposium on Traditional Medicine (AyurEx Colombo) – 2024*, Proceedings of the 2nd Symposium, Colombo, Sri Lanka.

11. Sewwandi Darshanamala, M.P.D., **Wijeweera, A.A.**, Wickramasinghe, I. & **Widanapathirana, C.U.** (2024) 'Determination of the effect of sulphur fumigation on cinnamon quills with spatial variation of fumigation chamber and its effect on cinnamon tea', *International Symposium on Agriculture and Environment 2024*, University of Ruhuna, Sri Lanka.

12. Viranjanee, D.V.R., **Pabasara, P.K.D.** & Gunathilaka, H.A.W.S. (2024) 'Evaluation of three planting pit preparation methods on cinnamon seedlings establishment in WL4 (Matara) agro-climatic zone, Sri Lanka', *Proceedings of 22nd Agricultural Research Symposium*, Wayamba University of Sri Lanka, pp. 741–745.

වෙනත් සේවාවන්

ඊට අමතරව, සාමාන්‍ය ජනතාවට ක්ෂේත්‍ර ඇගයීම්, ක්ෂේත්‍ර සහ සැකසුම් මධ්‍යස්ථාන ඇගයීම්, තවාන් සහතික කිරීමේ වැඩසටහන්, පිටස්තර පුහුණු වැඩසටහන් සහ රාජ්‍ය අංශය සමඟ පර්යේෂණ හවුල්කාරිත්වය හරහා සේවය සපයා ඇත. එසේම, පර්යේෂණ අංශය පසුගිය වසර තුළ ශ්‍රී ගැමුණු සහ ශ්‍රී විජය යන නව ප්‍රභේදවල උසස් තත්ත්වයේ කුරුඳු පැල 600 ක් නිකුත් කර ඇත. චීන ජනරජය සමඟ කුරුඳු අපනයන ගිවිසුම සාර්ථක කර ගැනීම සහ උතුරු කලාපය ඇතුළුව රටේ සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වලට කුරුඳු ව්‍යාප්ත කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ද පර්යේෂණ අංශය විසින් ඉටු කරන ලදී.



ප්‍රතීතනය කළ විද්‍යාගාර මගින් කර්මාන්තයට අවශ්‍ය පරීක්ෂණ සිදු කර වාර්තා සැපයීම.

කුරුඳු කර්මාන්තයේ සෑම පැතිකඩක්ම ආවරණය කෙරෙන විද්‍යාගාර සහ ක්ෂේත්‍ර පර්යේෂණ සිදු කිරීම.





වගාකරුවන්ට ක්ෂේත්‍ර උපදෙස් ලබා දීම සහ ක්ෂේත්‍ර ඇගයීම් සිදු කිරීම.


❖ ජාතික කුරුඳු කර්මාන්තය ආශ්‍රිතව සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානය-අදියර-1 (Cinnamon Gate - Stage1) - ප්‍රගතිය

සිනමන් ගේට් ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ අද්විතීය කුරුඳු උරුමය ගෝලීය වශයෙන් ප්‍රචලිත කිරීම සඳහා කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දියත් කරන ලද සුවිශේෂී වැඩපිළිවෙළකි. මෙම ව්‍යාපෘතිය මගින් රැකියා අවස්ථා නිර්මාණය කිරීම, කුරුඳු අගය දාමය ශක්තිමත් කිරීම සහ සංස්කෘතික ප්‍රදර්ශන තුළින් ශ්‍රී ලංකාවේ සත්‍ය කුරුඳු නිෂ්පාදනය පිළිබඳ ගෝලීය පිළිගැනීම ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. ගාල්ල පින්නදූව අධිවේගී මාර්ගයේ පිවිසුම ආසන්නයේ පිහිටා ඇති මෙම ව්‍යාපෘතිය කුරුඳු කර්මාන්තය හා බැඳුණු කෘෂි සංචාරක ව්‍යාපාරය, සංස්කෘතික සංරක්ෂණය සහ තාක්ෂණික නවෝත්පාදනය ඒකාබද්ධ කර පහත සඳහන් අංග වලින් යුතුව නිම කිරීමට අපේක්ෂා කෙරේ.

- කුරුඳු සම්බන්ධ පරිපාලනමය, උද්භිද විද්‍යාත්මක, සංස්කෘතිකමය ඉතිහාසය දැක්වෙන ආදර්ශ කෞතුකාගාරය.
- දේශීය කුරුඳු වන දර්ශක සහ වගා දර්ශක වලින් යුත් නැරඹුම් උද්‍යානය.
- වාණිජමය වශයෙන් කරනු ලබන ආදර්ශ කුරුඳු වගා බිම.
- කුරුඳු හා සම්බන්ධ ලිපි පොත්පත් කියවීමේ සහ මිලදී ගැනීමේ අංශය.
- කුරුඳු සැකසීම හා බැඳි තාක්ෂණය පෙන්නුම් කරන සහ සජීවී අත්දැකීම් ලබා ගත හැකි ආදර්ශ කුරුඳු සැකසුම් හා අගය එකතු කිරීමේ මධ්‍යස්ථානය.
- විවිධ දේශීය කුරුඳු නිෂ්පාදන එකම වහලකින් මිලදී ගත හැකි ස්ථානය (One stop shop).
- කුරුඳු මිශ්‍රිත ආහාර සහ පාන වර්ග රස බැලිය හැකි අවන්හල.
- කුරුඳු කර්මාන්තය ආශ්‍රිත ඉගෙනුම් මධ්‍යස්ථානය.

මෙම ව්‍යාපෘතියේ පළමු අදියර 2024 වර්ෂයේ ක්‍රියාත්මක වූ අතර 2024 වර්ෂය අවසානය වූ විට **සිනමන් ගේට් ව්‍යාපෘතියේ** පළමු අදියර සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 70 ක මුදලින් රුපියල් මිලියන 46.5 ක වියදමකට ලගා වූ අතර 72%ක භෞතික ප්‍රගතියක් සහිතව සක්‍රීයව ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

කොන්ත්‍රාත් වටිනාකම (රු. මි.)	අනුමත ප්‍රතිපාදන 2024 (රු. මි.)	වියදම 2023 (රු. මි.)	වියදම 2024 (රු. මි.)	සමුච්චිත වියදම 2024.12.31 දිනට (රු. මි.)
161.36	**70.00**	**21.85**	**46.51**	**68.36**








2.2 විශේෂ ජයග්‍රහණ :-

- **අනුකූලතාව සහ වෙළඳපොළ ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීම හරහා ලංකා කුරුඳු චීනයට අපනයනය සක්‍රීය කිරීම.**

2023 දී මහජන චීන සමූහාණ්ඩුවේ රේගු සාමාන්‍ය පරිපාලනය විසින් නිවේදන අංක 145 යටතේ ලංකා කුරුඳු ආනයනය කිරීම සඳහා නව ශාක නිරෝධායන අවශ්‍යතා හඳුන්වා දෙන ලදී. ඊට ප්‍රතිචාර වශයෙන් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ කුරුඳු අපනයනකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සපයන ලද අතර අපනයනකරුවන් 70 දෙනෙකු පමණ මෙම වැඩසටහන සඳහා ඉල්ලුම් කිරීම සඳහා කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි විය. චීනයේ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම අපනයනකරුවන්ගෙන් 90% කට වඩා වැඩි සංඛ්‍යාවක් විගණනය කළ අතර තෝරාගත් ලැයිස්තුව වැඩිදුර ඇගයීම සඳහා ජාතික ශාක නිරෝධායන සේවය වෙත ඉදිරිපත් කරන ලදී. ජාතික ශාක නිරෝධායන සේවය විසින් විගණනය සාර්ථකව අවසන් කිරීමෙන් පසු, පළමු ලැයිස්තුවේ අනුමත අපනයනකරුවන් වීඩියෝ තාක්ෂණය හරහා විගණනයක් සඳහා මහජන චීන සමූහාණ්ඩුවේ රේගු සාමාන්‍ය පරිපාලනය වෙත යොමු කරන ලදී. මෙම දැඩි ඇගයීම් ක්‍රියාවලිය අනුගමනය කරමින් මහජන චීන සමූහාණ්ඩුවේ රේගු සාමාන්‍ය පරිපාලනය විසින් ශ්‍රී ලංකාවේ කුරුඳු අපනයනකරුවන් 15 දෙනෙකු සිය ශාක නිරෝධායන වෙබ් පිටුවේ නිල වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති අතර, ඔවුන්ට චීනයට ලංකා කුරුඳු අපනයනය කිරීම සඳහා අවසර ලබා දී ඇත. මෙම ජයග්‍රහණය චීන වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ පැවැත්ම ශක්තිමත් කිරීමේ සහ කුරුඳු අපනයනයේ ගුණාත්මකභාවය සහ ආරක්ෂාව පිළිබඳ ඉහළම ප්‍රමිතීන් සහතික කිරීමේ වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කරයි.

- **ලංකා කුරුඳු සඳහා ගෝලීය පිළිගැනීම ඉහළ නංවාලීම සඳහා GI සහතිකකරණ ක්‍රියාවලියට පහසුකම් සැලසීම.**



2022 වසරේදී යුරෝපා සංගමයෙන් භූගෝලීය දර්ශක සහතිකය (Geographical Indication – GI)ලබාගත් පළමු සහ දැනට ඇති එකම ශ්‍රී ලාංකික නිෂ්පාදනය බවට ලංකා කුරුඳු පත් වූයේ එහි සුවිශේෂී සම්භවය, ගුණාත්මකභාවය සහ සාම්ප්‍රදායික නිෂ්පාදන ක්‍රම හඳුනා ගනිමිනි. මෙම සහතිකය කුරුඳු අගය දාමයේ සියලුම පාර්ශවකරුවන් සඳහා විවෘත වන අතර කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව GI සහතිකය ලබා දීමට අදාළ බාහිර විගණනය සිදු කරන අතර අපනයන සංවර්ධන මණ්ඩලය සහතික නිකුත් කිරීමේ අධිකාරිය ලෙස කටයුතු කරයි. 2024 වර්ෂයේ දී කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් GI සහතික 25 ක් නිකුත් කිරීමට පහසුකම් සලසා ඇති අතර එමඟින් ගෝලීය වෙළඳපොළ තුළ ලංකා කුරුඳු වල ප්‍රවේශය තවදුරටත් පුළුල් විය.



GI ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම, අනුරේඛීයතාවය ස්ථාපනය කිරීම, තත්ත්ව සහතික කිරීම සහ යුරෝපා සංගම් අවශ්‍යතා පිළිපැදීම සහතික කිරීම සඳහා තාක්ෂණික පුහුණුව සැපයීම සහ කුරුඳු ක්ෂේත්‍ර සහ සැකසුම් මධ්‍යස්ථානවල බාහිර විගණනයන් සිදු කිරීම සඳහා කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව සක්‍රීයව සම්බන්ධ වී ඇත. මෙම උත්සාහයන් හරහා ලොව සත්‍ය කුරුඳු හි සුවිශේෂී නිෂ්පාදකයා ලෙස ශ්‍රී ලංකාවේ ස්ථාවරය තවදුරටත් ශක්තිමත් කරයි.

➢ කුරුඳු කර්මාන්තය සඳහා වන මාර්ග සිතියමක් සකස් කර අවසන් කිරීම.

කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේදී එහි ඉදිරි ගමන් මග සහ කාර්යභාරය පිළිබඳ දළ මගපෙන්වීමක් දෙපාර්තමේන්තුව පිහිටුවීම සඳහා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් පෙන්වා දී තිබුණි. එසේ වුවද කුරුඳු අගය දාමය තුළ සිටින සියලු පාර්ශව නියෝජනය වන පරිදි ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ ඉදිරි ගමන් මග කෙසේ විය යුතු ද යන්න පිළිබඳ අදහස් විමසීමක් සිදු කිරීමටත්, ඒ මග පදනම්ව කුරුඳු කර්මාන්තය සඳහා දස අවුරුදු මාර්ග සිතියමක් සකස් කිරීමටත් අත්‍යාවශ්‍ය බව 2023 වර්ෂයේ දෙපාර්තමේන්තු කටයුතු ආරම්භයේදීම පියවර ගනු ලැබීය. මෙහිදී සියලු පාර්ශව නියෝජනය වන පරිදි 150කට ආසන්න පිරිසකගේ අදහස් විමසීම සඳහා වැඩමුළු 03ක් සංවිධානය කරන ලද අතර මේ කාර්යය සාර්ථක කර ගැනීම සඳහා මූල්‍ය දායකත්වය ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් සපයන ලදී. එම සංවිධානයේ අනුග්‍රහයෙන් කුරුඳු මාර්ග සිතියම සකස් කිරීමේ කටයුතු සඳහා තාක්ෂණික උපදේශකත්වය ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අචිනි ද සිල්වා මහත්මිය විසින් සපයන ලදී.

සියලු පාර්ශව සහභාගීත්වයෙන් සකස් කරන ලද දස අවුරුදු කුරුඳු කර්මාන්ත මාර්ග සිතියම කෙටුම්පත ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා වෙත 2024 ජූලි මස 10 වන දින කරන්දෙණියේදී උත්සවාකාරයෙන් පිළිගන්වන ලද අතර මෙම කෙටුම්පත සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ජාතික සැලසුම් සඳහා ඇතුළත් කිරීමට මේ වන විට පියවර ගෙන ඇත.

කුරුඳු කර්මාන්ත දස අවුරුදු මාර්ග සිතියම හා වත්මන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන “ පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ” පදනම් කර ගනිමින් හා ජාතික වැවිලි ප්‍රතිපත්තිය, එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක ඇතුලු ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්තීන්ට අනුගත වෙමින්, පාර්ශ්වකරුවන්ගේ අදහස් හා යෝජනා තවදුරටත් සැලකිල්ලට ලක් කරමින් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම මේ වන විට ආරම්භ කර ඇත.

➢ තත්ත්ව ප්‍රමිතීන් ශක්තිමත් කිරීම: ලංකා කුරුඳු සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සහතික කිරීමේ කාර්යභාරය.

යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (Good Agricultural Practices - GAP) යනු පාරිසරික සෞඛ්‍යය, සේවක ආරක්ෂාව සහ නිෂ්පාදන ගුණාත්මකභාවය කෙරෙහි අවධානය යොමු කරමින් ආරක්ෂිත හා තිරසාර කෘෂිකාර්මික නිෂ්පාදනය සහතික කිරීම අරමුණු කරගත් මූලධර්ම සහ භාවිතයන් සමූහයකි. 2024 දී කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පුළුල් විගණන ක්‍රියාවලීන් සිදු කිරීමෙන් පසු කුරුඳු ක්ෂේත්‍ර සඳහා GAP සහතික 50 ක් නිකුත් කරන ලද අතර, අදාළ ඉඩම් ජාත්‍යන්තර ප්‍රමිතීන්ගේ අනුකූලතාවය සහතික කරන ලදී. කුරුඳු සඳහා GAP සහතිකය නිකුත් කිරීමේ නිසි බලධාරියා ලෙස කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව කුරුඳු අගය දාමයේ පාර්ශවකරුවන්ට GAP සහතිකකරණ ක්‍රියාවලිය සහ ලේඛන කළමනාකරණය පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දීම සහ විගණනය හරහා අනුකූලතාවය තහවුරු කර ඇත. ගෝලීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ කුරුඳු වල විශ්වසනීයත්වය සහ තත්ත්ව සහතිකය තවදුරටත් ඉහළ නැංවීම උදෙසා මෙම වැඩසටහන විශේෂයෙන් ඉවහල් වී ඇත. චීනයට ලංකා කුරුඳු අපනයනය කිරීමේ වැඩසටහනේදී GAP සහතිකය මේ වන විට අනිවාර්ය අවශ්‍යතාවයක් වී ඇත.

➢ **කුරුඳු කර්මාන්තය ලෝක උරුමයක් බවට පත් කිරීම.**

2024 වසරේදී, ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ ඓතිහාසික වැදගත්කම, සාම්ප්‍රදායික කුරුඳු සකස් කිරීමේ අනන්‍ය ක්‍රමවේදය සහ කුරුඳු කර්මාන්තය හා බැඳුණු අප රටට ආවේණික උරුමයන් සහ දැනුම පද්ධතිය සැළකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තය හා බැඳුණු මහා සංස්කෘතිය, යුනෙස්කෝ අස්පර්ශනීය සංස්කෘතික උරුම අංග ජාතික ලැයිස්තුවට ඇතුළු කිරීම සඳහා, සංස්කෘතික අමාත්‍යාංශයේ, අස්පර්ශනීය සංස්කෘතික උරුම සුරක්ෂණ කමිටුව සහ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් යෝජනා කරන ලදී

2.3 අභියෝග :-

➢ **කුරුඳු ඵලදායීතාවය හා සම්බන්ධ සීමාවන් (Productivity Related Constraints)**

දැනට කුරුඳු වගා අක්කරයකින් ලැබෙන ජාතික අස්වැන්න කි.ග්‍රෑ.200-250 වන අතර එහි විභව අස්වැන්න අක්කරයට කි.ග්‍රෑ.400 කි. ඒ අනුව සමස්ත ඵලදායීතාවය 50%ක් වන අතර ඒ සඳහා පහත කරුණු හේතු වී ඇත.

- **පවතින කුරුඳු වගා ඉඩම් බහුතරයක නියමිත පැළ ගහනය වන අක්කරයට කුරුඳු පඳුරු 3600 ප්‍රමාණය නොමැති වීම.**

  මේ සඳහා පවතින වගා ඉඩම් වල පාළු සිටුවීමට අදාළ ක්‍රියාකාරකම් ඉටුකළයුතු වේ.

- **බොහොමයක් කුරුඳු ඉඩම් ආර්ථික වයස ඉක්මවූ පැරණි වගාවන් වීම.**

  මේ වනවිට සාම්ප්‍රදායිකව කුරුඳු වගා කරන ප්‍රදේශවල වැඩි වගාවන් ප්‍රමාණයක් අවුරුදු 50-60 වයස පැරණි වගාවන් වේ. මෙම ඉඩම් කොටස් වශයෙන් නැවත වගාකළ යුතු අතර ඒ සඳහා නැවත වගාකිරීමේ වැඩසටහන් (Replanting Programme) ක්‍රියාත්මක කළ යුතු වේ.

- **කුරුඳු වගාවන් සඳහා යොදන සැපයුම් සීමාවීම.**

  මෑත කාලීනව රසායනික පොහොර මිල අධික වීම නිසා පොහොර යෙදීම වසර 05පමණ කාලයක සිට අඩුවී ඇත. නියමිත පොහොර ප්‍රමාණය නොමැති වීම නිසා අස්වනු ලැබීම සීමා වී ඇත. එබැවින් සහන මිලට පොහොර ලබාදීම හෝ පොහොර මිල සමස්තයක් ලෙස මිලදී ගත හැකි සීමාවට අඩු කිරීම සිදු කළ යුතු වේ.

- **කුරුඳු සැකසුම් ශිල්පීන්ගේ හිඟය.**

  කුරුඳු අස්වනු සැකසීම පුහුණු ශිල්පීන් මඟින් සිදුකළ යුතු ක්‍රියාවලියකි. පාරම්පරිකව මෙම කටයුතුවල යෙදෙන පිරිස අඩුවීමත්, එම කටයුතු සඳහා තරුණ පරපුර ආකර්ශනය නොවීමත් ගැටළුවක් වී ඇත. එබැවින් මාස 06කට වරක් අස්වනු නෙළීමේ ක්‍රමය වෙනස් වී අවුරුද්දකට වරක් හෝ අවුරුදු දෙකකට

තුන්වරක් ලෙස කුරුඳු අස්වනු නෙළීමේ කාලය දීර්ඝ වී ඇත. මේ සඳහා දැනට කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ, මාතර පිහිටි කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු පාඨමාලා ආරම්භ කර ඇත. එය NVQ පාඨමාලාවක් ලෙස සිදුකිරීමට කටයුතු යොදමින් පවතී. ඊට අමතරව අදාළ ප්‍රදේශවලට ගොස් කුරුඳු සැකසුම් ශිල්පීන් පුහුණු කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දී ඇත.

- **කෘෂිකාර්මික කම්කරු හිඟය.**

සෑම ක්ෂේත්‍රයක්ම බලපා ඇති පරිදි කෘෂිකාර්මික කම්කරුවන් හිඟය හා කම්කරු කුලිය වැඩිවීම කුරුඳු කර්මාන්තයට බලපා ඇත. එබැවින් කුරුඳු වගාව තුළ අත්‍යාවශ්‍යයෙන්ම කළ යුතු වල් පාලනය, කුරුඳු පඳුරු පුහුණු කිරීම වැනි කටයුතු ක්‍රමයෙන් අඩුවී ඇත.

- **කුරුඳු සැකසීම යාන්ත්‍රීකරණය නොවීම.**

වෙනත් බෝග වලට මෙන් නොව කුරුඳු වගාවේ අස්වනු සැකසීම සඳහා යන්ත්‍ර භාවිතා කිරීම අවම වී ඇත. සැකසුම් කටයුතු සඳහා නවීන යන්ත්‍ර හඳුන්වාදීම කර්මාන්තයේ කාර්යක්ෂමතාව වැඩිකිරීමට අත්‍යාවශ්‍ය වී ඇත.

- **කුරුඳු වගාව තවදුරටත් ව්‍යාප්ත කිරීම.**

සාම්ප්‍රදායික කුරුඳු වගා කරන ප්‍රදේශවල තවදුරටත් කුරුඳු වගාව ව්‍යාප්ත කිරීමට ඉඩම් සපයා ගැනීම අසීරු වී ඇත. තවද, පවතින කුරුඳු වගාවන් පවුලේ අවශ්‍යතා මත කට්ටි කිරීම හා වෙනත් සංවර්ධන කටයුතු සඳහා යොදාගැනීම සිදුකරනු ලබයි. ලෝක වෙළඳපොළ ඉල්ලුමට සරිලන පරිදි කුරුඳු සැපයීම සඳහා කුරුඳු වගාව තවදුරටත් සාම්ප්‍රදායික මෙන්ම සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වලට ව්‍යාප්ත කළ යුතු වේ. මේ වන විට මහවැලි කලාපවල, උතුරු නැගෙනහිර, උතුරු මැද හා ඌව වැනි වියළි කලාපීය ප්‍රදේශ වලට කුරුඳු ව්‍යාප්ත කිරීමට කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතී. මීට වසර 05-06 සිට එම ප්‍රදේශ වල ගොවීන් කුරුඳු වගාව ආරම්භ කර ඇති අතර එය එම ප්‍රදේශවල ගොවීන් අතර ආකර්ශනීය වගාවක් බවට පත්වෙමින් පවතී. මෙම දෙපාර්තමේන්තුවට ඉහත ප්‍රදේශවල නිලධාරීන් අනුයුක්ත කර නොමැති වීම මත වගා ව්‍යාප්ති කටයුතු සම්බන්ධීකරණය කර ගැනීම අපහසු වී ඇත. මහවැලි අධිකාරියේ කෘෂි නිලධාරීන්, අදාළ ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් වගා කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් පවතී.

- **කුරුඳු කර්මාන්තයට නව තාක්ෂණය එකතු කිරීමට ඇති සීමාවන්. (Technology related constraints)**

කුරුඳු කර්මාන්තය සාම්ප්‍රදායිකව ගොඩනැගුණු කර්මාන්තයක් බැවින් කුරුඳු සකස් කිරීම සිදුවන්නේ සාම්ප්‍රදායික ක්‍රමවේදයකට වේ. එසේ වුවද ලෝක වෙළඳපොළ ජයගැනීම සඳහා මෙම කර්මාන්තය ආහාර නිෂ්පාදන ප්‍රමිතීන්ට අනුව අදාළ ප්‍රමිති සහතික සහිත ආහාර නිෂ්පාදන සැකසුම් කර්මාන්තශාලා

ආකාරයට පරිවර්තනය කළ යුතුය. සැකසුම් මධ්‍යස්ථාන සුලු ප්‍රමාණයක් මේ වන විට ISO 22000 ප්‍රමිතියට අනුව සකස් කර ඇති අතර එම කර්මාන්තශාලාවල ප්‍රමිතීන්ට අනුව කුරුඳු සකස් කරමින් පවතී. මෙම කර්මාන්තයේ අගය එකතු කළ නිෂ්පාදන සමස්තයක් ලෙස ගතහොත් 6% - 7%ප්‍රමාණය වේ. එබැවින් මෙම කර්මාන්තයෙන් වැඩි විදේශ විනිමයක් ඉපයීම සඳහා ක්‍රමානුකූලව මෙම තත්ත්වය 10% - 15% මට්ටමට පත්කළ යුතුය. එබැවින් ගෘහ කර්මාන්තයක් ලෙස (Cottage industries) පවතින කුරුඳු කර්මාන්තයේ සැකසුම් කටයුතුවල හැකි සෑම පියවරකටම යන්ත්‍ර හෝ මෙවලම් හඳුන්වාදීම එහි කාර්යක්ෂමතාව දියුණු කිරීමට හේතු වේ.

- **කුරුඳු අගය එකතු කළ නිෂ්පාදන**

සාම්ප්‍රදායිකව කුරුඳු අපනයනය කරනුයේ අමුද්‍රව්‍යයක් ලෙස වන අතර 90%ආසන්න ප්‍රමාණයක් කුරුඳු අපනයනය කරනු ලබන්නේ කුරුඳු කූරු සහ කැපූ කුරුඳු (Cut Cinnamon) ලෙස වේ. 6% - 7%ආසන්නව කුරුඳු කුඩු (Cinnamon Powder) කුරුඳු පොතු තෙල් (Cinnamon Bark Oil) කුරුඳු කොළ තෙල් (Cinnamon Leaf Oil) කුරුඳු තේ (Cinnamon Tea) කුරුඳු බීම (Cinnamon Drink) වැනි යම් ප්‍රමාණයක අගය එකතු කළ නිෂ්පාදන ලෙස අපනයනය කරනු ලබයි. මෙහිදී වැඩිදුර අගය එකතු කළ නිෂ්පාදන ලෙස කුරුඳු ඔලියොරෙසින (Cinnamon Olioresin), ශක්ති ජනක පාන, සුරතල් සතුන්ගේ ආහාර වැනි නිෂ්පාදන ද කුරුඳු කොළ තෙල් වැඩිදුර ආසවනය කර එය භාගික ආසවනය කර ඉයුජිනෝල් (Eugenol), ලිනලූල් (Linalool) වැනි සංඝටක වෙන් කර අපනයනයට සකස් කළ යුතුය. කුරුඳු අපනයනය සඳහා වෙළඳපොළ පවතින්නේ ඇමෙරිකාව, යුරෝපා සංගමය වැනි ඉහළ ආදායම් ලබන රටවල් සඳහා වන අතර එම වෙළඳපොළට අගය එකතු කළ නිෂ්පාදන අපනයනය සඳහා ඉහළ ප්‍රමිතියකින් යුක්තව නිෂ්පාදනය කළ යුතුය.

- **කුරුඳු අගය එකතු කළ නිෂ්පාදන වැඩිදියුණු කිරීමට පවතින සීමාවන්.**

  - සාම්ප්‍රදායිකව අපනයනය කරන අපනයනකරුවන් මෙක්සිකෝව, පේරු වැනි ලතින් ඇමෙරිකානු කලාපය මත රඳා පැවතීම. නව වෙළඳපොළ සොයා නොගැනීම කැපී පෙනෙන තත්ත්වයකි. විශේෂයෙන්ම සාම්ප්‍රදායික අපනයනකරුවන්ගේ දෙවන හා තුන්වන පරම්පරාව මේ වන විට අපනයන වෙළඳපොළ හසුරවන අතර මෙක්සිකෝව වැනි රටවල ගැනුම්කරුවන් සමඟ වසර 50-60 කාලයක් ගනුදෙනු සිදුකරනු ලබයි. එබැවින් දේශීය අපනයනකරුවන් ණයවර ලිපි (Letter of credit) වැනි ගෙවීම් ක්‍රමවේද වලින් බැහැරව ණය පදනම මත අපනයනය කිරීමට පෙළඹී ඇත. දින 90-120 අතර කාලයකට ණය පදනම මත අපනයනය කිරීමට පෙළඹී ඇත. එය නව අපනයනකරුවන්ට වෙළඳපොළට පිවිසීමට බාධාවක් වී ඇත.

  - සාම්ප්‍රදායික අපනයනකරුවන් කිහිප දෙනෙකු පමණක් අගය එකතු කළ නිෂ්පාදන අපනයනය කරන අතර ඉහළ ආයෝජනයක් සිදුකළ යුතු බැවින් ඒ සඳහා අනෙකුත් පිරිස් මැළිකමක් දක්වයි.

- කුරුඳු අගය එකතු කළ නිෂ්පාදන සඳහා අවශ්‍ය යන්ත්‍ර උපකරණවල මිල අධික වීම සහ ඒ සඳහා බදු සහන හිමි |නොවීම.

- අගය එකතු කළ නිෂ්පාදන අපනයනය කිරීම සුවිශේෂී වෙළඳපොළ (Niche Market) ඉලක්ක කර අපනයනය කළ යුතුය. එම වෙළඳපොළ සොයා ගැනීම සඳහා වෙළඳපොළ පර්යේෂණ (Market research) සිදු කළ යුතු අතර ඒ සඳහා විශාල ආයෝජනයක් කළ යුතුය.

- දේශීය කුරුඳු ගොවීන් / සැකසුම්කරුවන් 70% පමණ අක්කර 05 වඩා අඩු වගාවන් සිදුකරන බැවින් GMP / ISO22000 / HACCP වැනි සහතිකකරණ සහිත සැපයුම් මධ්‍යස්ථාන ගොඩනැගීම සඳහා ආයෝජනය කිරීමට අඩු නැඹුරුතාවක් ඇත. ඒ සඳහා ඔවුන්ට ආයෝජන ආධාර වැනි දිරිගැන්වීම් සිදු කළ යුතුය.

- කුරුඳු නිෂ්පාදනය සැකසීම සිදුකළ යුත්තේ මීට පෙර සඳහන් කළ පරිදි ජාත්‍යන්තරව පිළිගත් ආහාර නිෂ්පාදන ක්‍රියාවලීන්ට අනුගත වෙමිනි. එබැවින් ආහාර නිෂ්පාදනයේදී භාවිතා කරන Food Grade Stainless Steel වලින් නිෂ්පාදනය කරන ලද යන්ත්‍ර උපකරණ කුරුඳු නිෂපාදනයේදී භාවිතා කළ යුතු වේ. එම යන්ත්‍ර උපකරණ මිල අධික වීමත් ඒ සඳහා බදු සහන නොලැබීමත් සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඒ සඳහා යොමුකර ගැනීම ගැටළුවක් වී ඇත. එබැවින් කුරුඳු කර්මාන්තයට සම්බන්ධ පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් මධ්‍යම හා ඉහළ මට්ටමේ ආයෝජකයින් දිරිමත් කිරීම සිදුකළ යුතුය.
- ජාත්‍යන්තර ප්‍රමිති සහතික සහිත සැකසුම් කර්මාන්තයට යොමු |නොවීම.
- GMP (Good Manufacturing Practices), ISO 22000, HACCP, FSSC වැනි සහතික ලබා ගැනීමට ආයෝජකයින් දිරිමත් කළ යුතුය. ඒ සඳහා ආයෝජන ආධාර ක්‍රමයක් ඇති කිරීම අවශ්‍ය වේ.

- **ආයතනික සම්බන්ධ සීමාවන් (Institutional related constraints)**

  කුරුඳු කර්මාන්තය සඳහා විවිධ ආයතන වෙන් වෙන් වශයෙන් ක්‍රියාත්මක වන අතර එය කර්මාන්තය ඉදිරියට ගෙන යාමට බාධාවකි. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව, අපනයන සංවර්ධන මණ්ඩලය, විදේශ තානාපති කාර්යාල, විශ්ව විද්‍යාල හා පර්යේෂණ ආයතන එක්ව වැඩසටහනක් දියත් කළ යුතු ය. මෙම ආයතන එක්ව සාකල්‍ය ප්‍රවේශයක් (Holistic Approach) සහිතව ක්‍රියාත්මක විය යුතු වේ.

- **අලෙවිකරණය / වෙළඳපොළ හා සම්බන්ධ සීමාවන් (Market related constraints)**

  පෙර සඳහන් කළ පරිදි කුරුඳු නිෂ්පාදන අපනයනය මෙක්සිකෝව ඇතුළු ලතින් ඇමෙරිකානු කලාපයට සීමා වීම කර්මාන්තයේ පැවැත්මට බාධාවකි. මෙම කලාපයේ වාර්ෂික කුරුඳු අපනයන වටිනාකමේ වර්ධනය 1v- 2vඅතර වේ. එහෙත් ලෝකයේ අනෙකුත් කලාපවල මෙම වර්ධනය 7v-12vපමණ වේ.

එබැවින් නව වෙළඳපොළ සොයා ගැනීම හා අලෙවිකරණ උපාය මාර්ග තෝරාගැනීම ඉතා වැදගත් වේ. තවද කුරුඳු සඳහා සාම්ප්‍රදායික වෙළඳපොළ වන මෙක්සිකෝව හා ලතින් ඇමෙරිකානු කලාපයේ තවදුරටත් කුරුඳු ප්‍රවර්ධනය කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත.

මෙයට වසර 50 පමණ පෙර පැවති එම සාම්ප්‍රදායික වෙළඳපොළ තුළ කිසිදු ප්‍රවර්ධන කටයුත්තක් සිදු කර නොමැත. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ අපනයන ගමනාන්ත 15න් එකක් වන මෙක්සිකෝව සමඟ ශ්‍රී ලංකාවට තානාපති කාර්යාල නොමැත. මෙක්සිකෝවෙහි තානාපති කාර්යාලයක් පිහිටුවා කුරුඳු ප්‍රවර්ධනය හෝ එම කලාපයේ ඇති බ්‍රසීල ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ඔස්සේ ලතින් ඇමෙරිකානු කලාපයේ වෙළඳ පහසුකම් වැඩිදියුණු කිරීම සිදුකිරීම සත්‍ය කුරුඳු ප්‍රවර්ධනයට වැදගත් වේ.

2.4 ඉදිරි ඉලක්ක :-

- කුරුඳු නිෂ්පාදනය මගින් ශ්‍රී ලංකා ආර්ථිකයට කරනු ලබන දායකත්වය ඉහළ නංවාලීම.

විස්තරය	වාර්ෂික ඉලක්කය 2024	වාර්ෂික ඉලක්කය 2025
කුරුඳු නිෂ්පාදනය (මෙට්‍රික් ටොන් .මිලි.)	25,000	26,000
අපනයන ආදායම (රු.මිලි.)	73,800	75,000
අපනයන ආදායම (ඇ.ඩො.බිලි.)	225	260
අපනයන ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)	20,500	22,000
කුරුඳුවල සාමාන්‍ය අලෙවි මිල (කි.ග්‍රෑ. 1ක (රු.))	3,400	4,000
කුරුඳු වගා වපසරිය (හෙක්.)	37,400	38,000

- සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල කුරුඳු වගා ව්‍යාප්තිය ඉහළ නංවාලීම.
- කුරුඳු සංවර්ධන පනත සම්මත කර ගැනීම.
- කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම.
- මේ වන විට සකස් කර ඇති කුරුඳු කර්මාන්තයේ මාර්ග සිතියමට (Road Map) අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම.
- කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා උපාය මාර්ග සංවර්ධන සැලැස්ම සකස් කිරීම.
- නව තාක්ෂණය හා උපායමාර්ග තුළින් නව කුරුඳු අපනයන වෙළඳපොළ සොයා ගැනීම.

.....

අධ්‍යක්ෂ ජනරාල්

නම :

තනතුර :

දිනය :

L. M. J. K. Lindara
Director General (Acting)
Department of Cinnamon Development
Gunarathna Weerakoon Mawatha,
Borakanda, Karandeniya.

03. පරිච්ඡේදය

2024 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ප-අපේක්ෂිත අයවැය ප්‍රතිසාදන 2024 රු.		සටහන	කළඹ 2.024 රු.	2023 රු.
-	ආදායම් ලැබීම්		-	
-	ආදායම් බදු	1	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	
-	ජාතසන්තර වෙළඳාම් මත බදු	3	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	
-	මූල ආදායම් ලැබීම් (අ)		-	
-	ආදායම් නොවන ලැබීම්		-	
	භාණ්ඩාගාර අලිම		153,251,327 00	
	තැන්පතු		34,521,012 00	
100,000 00	අත්තිකාරම් නිකුතුම්		1,298,422 00	
	වෙනත් ප්‍රධාන ලෙජර් නිකුතුම් ලැබීම්		-	
100,000 00	මූල ආදායම් නොවන ලැබීම් (ආ)		189,070,761 00	-
100,000 00	මූල ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		189,070,761 00	-
	භාණ්ඩාගාරයට ලේඛණ (ඇ)		27,794,697 00	
100,000 00	අද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		161,276,064 00	-
-	අඩු කළා : වියදම් ප්‍රතිසංවිධානය වියදම්		-	
73,000,000 00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	63,691,106 00	
39,000,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	20,430,164 00	
18,000,000	සභනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	-	
-	පොළී ගෙවීම්	8	173,020 00	
-	වෙනත් ප්‍රතිසංවිධානය වියදම්	9	-	
130,000,000	මූල ප්‍රතිසංවිධානය වියදම් (ඊ)		84,294,290 00	-
	මූලධන වියදම්			
10,000,000 00	මූලධන වත්කම් ප්‍රතිසංස්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	2,961,941 00	
91,500,000 00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	66,161,666 00	
	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	
500,000 00	තැකීම්ය වර්ධනය	14	220,615 00	
	වෙනත් මූලධන වියදම්	15	-	
102,000,000 00	මූල මූලධන වියදම් (උ)		69,344,222 00	-
	තැන්පතු ගෙවීම්		27,235,431 00	
50,000,000	අත්තිකාරම් ගෙවීම්		9,741,773 00	
	වෙනත් ප්‍රධාන ලෙජර් නිකුතුම් ගෙවීම්			
50,000,000	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		106,321,426 00	
282,000,000	මූල වියදම් එ = (ඊ+උ+ඌ)		190,615,716 00	
-	දෙසැම්බර් 31 දිනට හේතය ඒ = (ඉ-එ)		(29,339,652 00)	
	අලිම තැටුම් ප්‍රකාශනය අනුව හේතය		(29,339,652 00)	
	දෙසැම්බර් 31 දිනට අලිම හේතය		-	
			(29,339,652 00)	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	නත්‍ය 2024 රු.	2023 රු.
-	ආදායම් ලැබීම්		-	
-	ආදායම් බදු	1	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	
-	බදු නොවන ආදායම් හා වරනත්	4	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	
-	ආදායම් නොවන ලැබීම්		-	
	භාණ්ඩාගාර අග්‍රිම		153,251,327.00	
	නැන්පතු		34,521,012.00	
100,000.00	අත්තිකාරම් ගිණුම්		1,298,422.00	
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	
100,000.00	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**189,070,761.00**	-
100,000.00	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**189,070,761.00**	-
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		27,794,697.00	
100,000.00	ඉද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		161,276,064.00	-
	අඩු කළා : වියදම්			
-	ප්‍රතිසංස්කරණ වියදම්		-	
73,000,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	63,691,106.00	
39,000,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	20,430,164.00	
18,000,000	ස්ථානාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	-	
-	පොළී ගෙවීම්	8	173,020.00	
-	වෙනත් ප්‍රතිසංස්කරණ වියදම්	9	-	
130,000,000	මුළු ප්‍රතිසංස්කරණ වියදම් (ඊ)		**84,294,290.00**	-
	මූලධන වියදම්			
10,000,000.00	මූලධන වත්කම් ප්‍රතිනිර්මාණය හා වැඩිදියුණු කිරීම්	10	2,961,941.00	
91,500,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	66,161,666.00	
	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	
500,000.00	හැකියා වර්ධනය	14	220,615.00	
	වෙනත් මූලධන වියදම්	15	-	
102,000,000.00	මුළු මූලධන වියදම් (උ)		**69,344,222.00**	-
	නැන්පතු ගෙවීම්		27,235,431.00	
2, ~~60~~,000,000	අත්තිකාරම් ගෙවීම්		9,741,773.00	
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			
50,000,000	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**106,321,426.00**	
282,000,000	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		190,615,716.00	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(29,339,652.00)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(29,339,652.00)	
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	
			(29,339,652.00)	

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තනය 2,024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියක හා උපකරණ	ඵඹඒ-6	72,738,328.00	-
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඵඹඒ-5/5(ඒ)	8,443,351.00	-
මුදල් හා මුදල් සමාන දෑ	ඵඹඒ-3	-	-
මුළු වත්කම්		**81,181,679.00**	-
ඉද්ධ වත්කම් / බැඳීම්			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		1,157,830.00	-
දේපළ පිරියක හා උපකරණ සංචිතය		72,738,328.00	-
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඵඹඒ-5(ඩී)		
ප්‍රාග්ම වගකීම්			
නැන්පතු ගිණුම්	ඵඹඒ-4	7,285,521.00	-
අනිම ශේෂය	ඵඹඒ-3	-	
මුළු වගකීම්		**81,181,678.66**	-

පිටු අංක...01....සිට ...37..... දක්වා ඵඹඒ 1 සිට ඵඹඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...38.... සිට ...46.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, රිට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනා සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය :	දිනය :	දිනය :
ඩී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති ලේකම් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය 8 වන මහල, සෙත්සිරිපාය අදියර II, බත්තරමුල්ල	එල්. එම්. කේ. කේ. ලින්දර ජනරාල් (වැ.බ.) කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව	එම්. පී. වික්‍රමසේන පියදසේන ගණකාධිකාරි (වැ.බ.) අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒකක-ඉ

.....2024-12-31..... දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2,024	2023
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය බදු ලැබීම්	-	-
භාණ්ඩ, අධිභාර, දේවාලුදල් සහ බලපත්‍ර	-	-
ලාභ		-
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් කිරීම් වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,273,688.13	-
අලුම් ලැබීම්	153,251,326.91	-
අත්කිකාරම් අයකර ගැනීම්	932,378.00	-
තැන්පතු ලැබීම්	34,521,011.00	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	189,978,404.04	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුදුසල පඩිනැඩි හා මෙහෙයුම් වියදම්	38,808,496.00	
පහනාධාර සහ ආරුකිරීම්	-	
වෙනත් වැය කිරීම් වෙනුවෙන් දරන ලද වියදම්	32,076,130.00	
භාණ්ඩාගාරයට පියවන ලද අලුම්	27,794,697.04	
අත්කිකාරම් මෙවීම්	1,416,523.00	
තැන්පතු මෙවීම්	27,235,431.00	
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ඇ)	127,331,277.04	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ඉදිරි මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ඇ)	62,647,127.00	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා හෙංගිත වත්කම් විකිණීම්	-	-
උපාය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	62,647,127.00	
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	62,647,127.00	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ඉදිරි මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(62,647,127.00)	
ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)	-	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු මෙවීම්	-	-
විදේශීය ණය ආපසු මෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

සටහන-(iv)

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය:
වැඩසටහන් අංකය හා නාමය:සංවර්ධන වැඩසටහන

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු .... එකතුව	නැත					XX XX
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල .... එකතුව						XX XX
3. වෙනත් (පෞද්ගලික අංශය) .... එකතුව						XX XX
මුළු එකතුව						

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :

සටහන-(v)

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (ii)

මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය:
වැඩසටහන් අංකය හා නාමය:02-සංවර්ධන වැඩසටහන

පුද්ගලයාගේ/ආයතනයේ නම* (ප්‍රතිපාදන මාරු කරන විට හඳුනාගෙන තිබිය යුතුය)	වගකීම් පිළිබඳ විස්තරය	ණයවර ලිපි අංක ආදිය	ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද				තැන්පතු ගිණුම් අංකය	මාරුකරන ලද මුදල රු.
			ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය		
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු .... එකතුව			නැත					XX XX
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල .... එකතුව								XX XX
3. වෙනත් (පෞද්ගලික අංශය) .... එකතුව								XX XX
මුළු එකතුව								

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :

සටහන-(iii)

බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

විශේෂ වියදම් ඒකකයේ/අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ : කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය:337

වැඩසටහන් අංකය හා නාමය:02-සංවර්ධන වැඩසටහන

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් අංකය	මාසය	දිනය	ශීර්ෂය	වැඩ සටහන	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂයය	මූල්‍යකරණය	අයිතමය	බැඳීම්	බැඳීම් ශේෂය	බැරකම්වලට ඇතුළත් වූ දිනය	බැරකම් වටිනාකම	බැරකම් නිදහස් කිරීම්	බැරකම් ශේෂය
පුද්ගලයාගේ/ආයතනයේ නම																
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල																
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී	12	දෙසැම්බර්	2025.01.16	337	2	1	0	1402	II					16,876.38		16,876.38
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී	28	දෙසැම්බර්	2025.01.16	337	2	1	0	1402	II					9,022.45		9,022.45
එකතුව																
මුළු එකතුව																25,898.83

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :

සටහන-(vi)

ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය :02-සංවර්ධන වැඩසටහන

	රු.
(1) ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන්කිරීමද ඇතුළුව 2020 ඇස්තමේන්තුගත වෙන්කිරීම්	නැත
(2) ඉහත (1) ට අදාළ 2024 වසර්ය තුළදී දරන ලද මුළු වියදම	.....
(3) 2024 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත නිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව	.....
(4) 2023හා ඊට පෙර වසර්වලට අදාළව, 2024වසර්ය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (ඇත්නම්)	.....
(5) 2023 වසර්ය සම්බන්ධයෙන් 2023 වසර්ය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව	.....
(6) 2023හා ඊට පෙර වසර් වෙනුවෙන් වූ හිමිකම්පෑම් සම්බන්ධයෙන් 2024 වසර්යේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව	.....
(7) 2024 වසර්ය සම්බන්ධයෙන් 2024 වසර්ය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව	.....
(8) 2023 හා ඊට පෙර වසර් වෙනුවෙන් 2024 වසර්ය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව	.....
(9) 2024 වසර්ය වෙනුවෙන් 2024වසර්ය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	.....
(10) 2024 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව නිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව {(3+4+5) - (6+7) } - (8+9)	.....
(11) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා2023 වසර්ය සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව	.....
(12) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2024 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	.....
(13) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (10 + 11 - 12)	.....

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/අධ්‍යක්ෂ (මුදල්) / කොමසාරිස් (මුදල්)
දිනය

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

ඇමතිතුමාගේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය 337

වැඩසටහන් අංකය හා නාමය : 2

සටහන -(i)

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අභය			සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		
රු	25,000.01	වැඩි		
	එකතුව		0	0

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

අභය			සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		
රු	25,000.01	වැඩි		
	එකතුව		0	

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :

සටහන-(vii)

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය:

වැඩසටහන් අංකය හා නාමය: 02-සංවර්ධන වැඩසටහන

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
		නැත		

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :

වියදම් ශීර්ෂ අංකය : 337 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව
වැඩසටහන් අංකය හා නාමය:

1 වර්ෂය තුළ සිදුවූ මූ.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අභය		සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i)	රු. 25,000.00 අඩු	.....	නැත ....
(ii)	රු. 25,000.01 වැඩි	.....	....
	එකතුව		

2 වර්ෂය තුළ මූ.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය

අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම් සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1						
2						
3						
4						
5						
6						
එකතුව						

සටහන - සටහන(i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මූ.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

අදාල නොවේ.

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ v ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	125,000.00	112,000.00	84,294.29	75%
ප්‍රාග්ධන	15,000.00	102,000.00	69,344.22	68%
මුළු එකතුව	140,000.00	214,000.00	153,638.51	72%

3.7 මු.රෙ 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000


අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ vලෙස
			මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
01	කෘෂිකර්මාන්ත සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය 118-2-3-88-2509	කෘෂිකර්ම නවීකරණ වැඩසටහන යටතේ ලංකා කුරුඳු නගා සිටුවීම සඳහා වන බහු ආංශික ප්‍රවේශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට.	35,000.00	35,000.00	31,750.00	90.71%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය v ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	26,027.49	26,027.49	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	200.00	200.00	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	46,510.83	46,510.83	-	72%
9180	බඳු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

Received
5 MAY 2025
Department of Cinnamon Development, Karandeniya.

මගේ අංකය / எனது இல. / My No. SPCG/GL/C/DCD/FA/2024
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2025 මැයි 01 දින.

අධ්‍යක්ෂ,
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව,
කරන්දෙණිය .

ශීර්ෂය 337 - කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එන්.ඒම්.එස්.ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති (වැ.බ.) වෙනුවට

පිටපත්: 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - කරුණු දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා
2. ලේකම් - වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

අංක 306/72, පොළුවිල පාර, මිරිස්සමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය எனது இல. My No. SPCG/GL/C/DCD/FA/2024 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2025 මැයි 09 දින

අධ්‍යක්ෂ ජෙනරාල්,
කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුව,
කරන්දෙණිය.

ශීර්ෂය 337 - කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 337 - කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන් දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 09 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින් , මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් අංක 01 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන්
මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර

එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එම ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම් පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 මූල්‍ය නොවන වත්කම්

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ තුරුසවි අරමුදල වෙතින් කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුවට ලද කාර්යාලීය උපකරණ අයිතම 09 ට අදාළ ඒකක 21ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2023 දෙසැම්බර් 28 දිනැති අංක 59/2023 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබා දී ඇති 2024 ජනවාරි 24 දිනැති අංක අමප/24/0089/612/008 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් කුරුදු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය, කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා දී ඇති බැවින් එහි ඇති සියලු වත්කම්, ගොඩනැගිලි, ඉන්වෙන්ට්‍රි අයිතම කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ගිණුම්ගත කළ යුතු වුවද වර්ග අඩි 17,812ක ගොඩනැගිලි 21 ක්ද සණ අඩි 1,125 ක් වූ එක් ගොඩනැගිල්ලක ස්වරූපයෙන් වූ වතුර ටැංකිය සහ අංශ 09ට අදාළ ඉන්වෙන්ට්‍රි අයිතම ඇතුළු වාහන 02ක් අගය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.5.2 ලේඛන හා පොත්පත් පවත්වා නොකිබීම

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ පහත දැක්වෙන ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබූ අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබෙන බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය		අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	බැරකම් පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 214	පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ආ)	දෙපාර්තමේන්තු වැය ලෙජරය	මුදල් රෙගුලාසි 447	යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ඇ)	පුද්ගල පඩිනඩි ලේඛනය	මුදල් රෙගුලාසි 453	පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබුණි.
(ඈ)	වත්කම් ලේඛනය	මුදල් රෙගුලාසි 454	ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඉ)	ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 891 (1)	පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ඊ)	ණය සහ අත්තිකාරම් ලේඛනය	2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 වන වගන්තිය	සී.සී.10 ආකෘතිය ක්‍රමවත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

02. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා මුළු අග්‍රිම ලැබීම් රු.මිලියන 179.16 ක් වූ අතර අක් මුදල් ඉල්ලීම් කල වවුචර් පත්වලට හැර වෙනත් වවුචර්පත් වලට ගෙවීම් කරන ලද අවස්ථා විගණනයට නිරීක්ෂණය විය. ඒ අනුව 2024 ඔක්තෝබර් මාසයේ වවුචර් 14ක් සඳහා රු.401,077 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් නිවැරදිව අග්‍රිම ඉල්ලුම් නොකිරීම නිසා ලද අග්‍රිමයෙන් සියයට 18 කට සමාන රු.මිලියන 27.80 ක් නැවත භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.
දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී සැලැස්මට අනුකූල නොවන පරිදි ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම, ක්‍රියාකාරී සැලැස්ම තුළ පවතින සම්පත් හා කාලය අනුව ක්‍රියාත්මක කළ නොහැකි ක්‍රියාකාරකම් ඇතුලත් කිරීම , සංවිධාන ව්‍යුහය තුල තනතුරු පුරප්පාඩු රාශියක් පැවතීම හා ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කාර්යයන් වර්ෂය තුල සැලසුම් කල පරිදි ඉටු නොකිරීම යනාදිය මේ සඳහා හේතු වී තිබුණි.

(අ) ගොඩනැගිලි සහ ඉදිකිරීම් වැය විෂය (2104) සඳහා සමාලෝචිත වර්ෂය තුළ පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.මිලියන 70 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද එයින් රු.මිලියන 23.49 ක වටිනාකමක් වර්ෂය අවසානයේදී ඉතිරිව තිබුණි. මුදල් රෙගුලාසි 78 (3)(ඉ)(II) ප්‍රකාරව තවදුරටත් වියදම් කිරීමට අවශ්‍ය වන මුදල් සඳහා බිල්පත් නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව පරිපූරක ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම මත මෙසේ ප්‍රතිපාදන ඉතිරිව පැවති බව නිරීක්ෂණය වූ අතර එය මුළු පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 33.56 ක් බවද නිරීක්ෂණය විය.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 20 ක එකතුව රු.මිලියන 27.33 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක එකතුව රු.මිලියන 32.64 ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරිව පැවතුණි.

i. පුනරාවර්තන වැය විෂයයන් 20 ක් සම්බන්ධයෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී සියයට 32.15 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එය අවම සියයට 08 සිට සියයට 94 ක් වැනි පරාසයක් අතර විය.

ii. 2104 ප්‍රාග්ධන වැය විෂය හැර සෙසු වැය විෂයයන් 06 සම්බන්ධයෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී සියයට 39.46 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එය සියයට 56 සිට සියයට 97 ක වැනි ඉහළ පරාසයක් වන බවද නිරීක්ෂණය කෙරේ.

2.3 බැරකම් සහ බැඳීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් ලබා ගෙන තිබූ භාණ්ඩ හා සේවා සඳහා රු.252,322 ක් ගෙවීම් 2025 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාසවලදී සිදු කර තිබුණි. එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයට සටහන III ඇතුලත් කර නොතිබුණි. ඒ අනුව එම ගෙවීම් සමාලෝචිත වර්ෂයේ බැරකම් ලෙස හඳුනාගෙන නොතිබූ බව නිරීක්ෂණය කරන ලද අතර මෙය 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 255/2017ට ද පටහැනි බව නිරීක්ෂණය කෙරේ.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති රීති, රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. රෙගුලාසි 138	විගණනය විසින් සිදුකල නියැදි පරීක්ෂාවේදී එකතුව රු.49,030 වූ ගෙවීම් වවුවර්පත් 13 ක් වියදම් සහතික කිරීමකින් තොරව ගෙවා තිබුණි.
ii. 2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සංශෝධිත මුදල් රෙගුලාසි 756(6)	දෙපාර්තමේන්තුව විසින් 2025 මාර්තු 06 වනම විගණිත දින වන විටත් සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිම කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3.1 වගන්තිය

චක්‍රලේඛයේ විධිවිධානයන්ට අනුව දෙපාර්තමේන්තුව යටතේ පවතින කුරුදු පර්යේෂණ ආයතනයේ වාහන 02 සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි .

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) යෝජිත ජාතික කුරුදු කර්මාන්ත හා සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීම් සඳහා ඉකුත් වර්ෂවල සහ සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 83.10 ක වියදමක් දරා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ ව්‍යාපෘතිය අවසන්ව නොතිබූ අතර එහි භෞතික ප්‍රගතිය සියයට 72 ක තරම් ප්‍රමාණයක් වූ බව නිරීක්ෂණය විය.

(ආ) උචිත තාක්ෂණය භාවිතයෙන් කුරුදු නිෂ්පාදනවල ඉණක්වය වැඩිදියුණු කිරීම හා අගය එකතු කිරීමේ නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිත සහතික ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේ අවධානය යොමු වී නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

පවත්නා කුරුදු වගාවන්හි ඵලදායීතාවය ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ උපරිම අස්වැන්නක් ලබා ගැනීම උදෙසා ඉඩමේ නියමිත පැළ ඝනත්වය පවත්වා ගැනීමට පාළු පැළ සිටුවීම සඳහා සහනාධාර පදනම යටතේ පැළ ලබාදී තිබුණි. මෙහිදී විගණිත දිනය වූ 2025 ජනවාරි 08 දින වන විටත් ප්‍රතිලාභීන් 1,135 ක් සඳහා රු.මිලියන.29.14 ක් වටිනාකමින් යුත් කුරුදු පැළ 1,006,970 ක් ලබාදී තිබුණි. එම පැළ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර කරභකාරී වාසි ලබා ගැනීමට කටයුතු සිදු නොකර ප්‍රතිලාභීන්ට ආසන්නතම පැළ තවාන්කරුවන්ගෙන් පැළ ලබා ගැනීම සිදුකර තිබුණි. තවද මෙම වැඩසටහන සඳහා

ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී අනුමත ගොවි සංවිධාන යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

3.3 වක්කම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට ,අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට, ශ්‍රී ලංකා මෙහෙයුම් අධීක්ෂණ ආයතනයට හා ජල සම්පාදන හා රාජ්‍ය යටිතල පහසුකම් අමාත්‍යාංශයට අයත් තක්සේරු වටිනාකම රු.මිලියන 21.87ක් වූ වාහන 04 ක් සහ තක්සේරු වටිනාකම හඳුනා නොගත් තවත් වාහන 03 ක් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව යටතේ පවතින කුරුදු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ කුරුදු වගාවේ පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා යොදා ගන්නා ඉඩම් ප්‍රමාණය හැර තවත් අක්කර 17.5 ක තරම් වූ ප්‍රමාණයක් පැවතියද අවසන් වසර 10 තුළ ඉන් අක්කර 10 ක ප්‍රමාණයක් විවිධ බාහිර පාර්ශවයන්ට බදුදීමට කටයුතු කර තිබූ අතර ඉතිරි අක්කර 7.5 ක ප්‍රමාණයෙන් ආදායම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සාමාන්‍ය පාලනයක් යටතේ කුරුදු වගාවෙන් අවම වශයෙන් වසරකට එක් වතාවක් හෝ අස්වනු නෙලාගත යුතු අතර අස්වනු නෙලන කාල පරාසය වැඩිවීමෙන් කුරුදු කඳන් මෙරීම නිසා දැව ප්‍රතිශතය වැඩි වන අතර පොත්තේ බරෙහි සැලකිය යුතු වැඩිවීමක් සිදු නොවීම හා ඉණාත්මක බව අඩුවීමක් සිදුවේ. කෙසේ නමුත් කුරුදු පර්යේෂණ ආයතනයේ ක්ෂේත්‍රයේ ඇති කුරුදු වගාවෙන් අවසන් වසර 10 තුල 2018, 2020, 2022, 2023 හා 2024 වර්ෂවල අස්වනු නෙලීමට කටයුතු නොකිරීම නිසා දළ වශයෙන් රු.10,507,785 ක පමණ ආදායමක් අහිමි වී ගොස් තිබුණි.

(ඈ) කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්දේශ වලට අනුව අක්කරයට කුරුදු පැළ 3,600 ක් තිබිය යුතු වුවද පර්යේෂණ ආයතනයේ අක්කර 17.5 ක තරම් ප්‍රමාණයක පැවති පැල ප්‍රමාණය විගණනයට ලබාදුන් ඉංජිනේරුගේ අනුව පැල

යුතු අතර පැල 45,000 ක අඩුවක් කුරුදු වගාවේ පැවතීම නිසා ආදර්ශමත් වගාවක් පවත්වා ගත යුතු කුරුදු පර්යේෂණ ආයතනය,මෙම ඉඩමේ කුරුදු වගාව මනා කළමනාකාරිත්වයකින් යුක්තව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කල යුතු බව නිරීක්ෂණය කෙරේ. මේ නිසා ආර්ථිකයට ආසන්නම වර්ෂයේ පමණක් රු.මිලියන 18.37 ක් අහිමි වී තිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමට සහ කාර්යාල පහසුකම් සඳහා මාසිකව රු.300,000 ක කුලියකට ඉදිරියට වර්ෂ 03 ක කාලයක් සඳහා පෞද්ගලික පාර්ශවයකට අයත් ගොඩනැගිල්ලක් යොදාගෙන තිබුණි.නමුත් ආයතනය සඳහා නිත්‍ය ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවශ්‍යතාවය 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුමෙන් හඳුනාගෙන නොතිබුණි.තවද මෙම තත්වය වර්ථමානයේ රජයේ කාර්යාල පවත්වා ගෙන යාමේ රාජ්‍ය ප්‍රතිපත්තියටද පටහැනි බව නිරීක්ෂණය කෙරේ.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 1.32 වියදමක් දරා කාර්යාල ගොඩනැගිලි පරිශ්‍රයේ ඉදිකිරීම් කර තිබූ අතර, කුලී පදනම මත ලබාගත් මෙම පරිශ්‍රය තුළ මෙවන් ඉදිකිරීම් සිදු කිරීම තුලින් නැවත වෙන ගොඩනැගිල්ලක් වෙත යොමු වීමේ දී මෙම වියදම් නිෂ්කාර්ය වියදම් බවට පත්විය හැකි බව විගණනයේ දී අනාවරණය වූ අතර, ගොඩනැගිල්ලේ දීමනාකරු සමග මෙම ඉදිකිරීම් සම්බන්ධව ඇතිකර ගත් එකඟතා පිළිබඳව විගණනයේ දී අනාවරණය නොවීය.

04. යහපාලනය

4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) විශ්ලේෂණ කටයුතු හා දත්ත රැස්කිරීමේ කටයුතු සඳහා භාවිතා කිරීම වෙනුවෙන් 2016, 2017 හා 2019 යන වර්ෂයන්හිදී කුරුදු පර්යේෂණ

ආයතනයට ලැබී තිබූ එකතු වටිනාකම රු.මිලියන 25.35 ක් වූ යන්ත්‍ර හා උපකරණ අයිතම 06 ක් සහ මිලදී ගත් වටිනාකම සඳහන් නොවූ යන්ත්‍ර හා උපකරණ අයිතම 02ක් 2021 සිට 2024 කාල පරාසයක් තුළ අක්‍රිය තත්ත්වයට පත්ව තිබුණි. ඒ හේතුවෙන් විවිධ පරීක්ෂණයන්ට අදාළව ලැබෙන සාම්පල්වල විශ්ලේෂණ කටයුතු හා විවිධ දත්ත රැස්කිරීමේ කටයුතු සිදු කර ගැනීමට නොහැකි තත්ත්වයකට ආයතනය පත් ව තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) පර්යේෂණ මධ්‍යස්ථානයේ පවත්නා වූ යන්ත්‍ර අක්‍රිය වීම හේතුවෙන් 2025 ජනවාරි 09 වන දිනට වර්ග 03 කට අයත් විවිධ පරීක්ෂණ 4,820 ක ප්‍රමාණයක් සිදු කිරීමට නොහැකිව තිබූ අතර ඒ හේතුවෙන් ආයතනයට රු.417,900 ක ආදායමක් අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) පර්යේෂණ සිදු කිරීමේදී ඒ සඳහා අවශ්‍ය උපකරණ නොමැති වීම, අවශ්‍ය පුහුණු වීම් නොලැබීම, පරීක්ෂා කරන ලද නිෂ්පාදන වාණිජකරණය කිරීම ගැටළු හේතුවෙන් පර්යේෂණයන් සාර්ථකව අවසන් කර ඉන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමේ ප්‍රශ්නගත තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 යන රෙගුලාසිවල දැක්වෙන විධිවිධානයන් සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ඊ වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් ද සිදුකර නොතිබූ අතර අභ්‍යන්තර විගණන ඒකකයක් ද පිහිටුවා නොතිබුණි. තවද අභ්‍යන්තර විගණන තනතුර මේ දක්වා පුරප්පාඩුව පවතී.

05. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පුරප්පාඩු 45 ක් පැවති බව නිරීක්ෂණය විය. මෙයින් ප්‍රධාන වශයෙන් කුරුඳු සංවර්ධන නිලධාරී තනතුරෙහි පුරප්පාඩු පැවතීම නිසා

(ඇ) කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පුරප්පාඩු 45 ක් පැවති බව නිරීක්ෂණය විය. මෙයින් ප්‍රධාන වශයෙන් කුරුඳු සංවර්ධන නිලධාරී තනතුරෙහි පුරප්පාඩු පැවතීම නිසා ආයතනික අරමුණු ඉටු කර ගැනීමේදී එය බාධාකාරී විය හැකි බව නිරීක්ෂණය කෙරේ.

(ආ) අරමුණු ඉලක්ක සපුරා ගැනීමේදී දෙපාර්තමේන්තු මෙහෙයුම් හා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන කාර්ය භාරයන් ඉටුකරනු ලබන පරිපාලන නිලධාරී, ගණකාධිකාරී (ස්ථිර), තාක්ෂණ නිලධාරීන් යන තනතුරු සඳහා කිසිවකු සේවයේ යොදාගෙන නොනිබුණු අතර එම තනතුරු 04 පුරප්පාඩු වී පැවතුණි. තවද ගණකාධිකාරී තනතුර සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරියකු අනුයුක්ත කර තිබුණි. ආයතනික අරමුණු ඉටුකර සඳහා එම නිලධාරීන් කඩිනමින් යොදවා ගැනීමේ අවශ්‍යතාව විගණනයේදී පෙන්වා දෙනු ලැබේ.

එන්.ඒම්.එස්.ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැඩබලන)වෙනුවට

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (y ලෙස සත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
පාළු සිටුවීම මගින් ඵලදායීතාව ඉහළ නංවා ඇති භූමි ප්‍රමාණය	100%		
පාළු සිටුවීම සඳහා නිකුත් කරන ලද පැළ සංඛ්‍යාව	100%		
ස්ථාපිත කරන ලද නව සැකසුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව	100%		
වැඩිදියුණු කර පවතින සැකසුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව			67%
පසු අස්වනු තාක්ෂණික උපකරණ සංඛ්‍යාව	100%		
නිකුත් කරන ලද GAP සහ GI සහතික සංඛ්‍යාව	100%		
ධාරිතා සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව		87%	
Cinnamon Gate ව්‍යාපෘතියේ ඉදිකිරීම්			72%
වසර සඳහා නියමිත පර්යේෂණ වැඩසටහනේ කොටස් සම්පූර්ණ කිරීම	90%		
පර්යේෂණ සොයාගැනීම් ප්‍රකාශයට පත් කිරීම් සංඛ්‍යාව	90%		
නිකුත් කරන ලද පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව	95%		
ක්ෂේත්‍ර උපදේශන සහ සේවා ප්‍රමාණය	99%		
පුහුණු කිරීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	98%		
ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය	99%		
විශ්ව විද්‍යාල සහ ක්ෂේත්‍රයේ හවුල්කාර පාර්ශවයන් සමඟ සිදු කරන ලද පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව	90%		
නව කුරුඳු ප්‍රභේදවලට අයත් පැළ නිකුත් කිරීම	90%		
පැළ තවාන් පරීක්ෂාව	99%		
උසස් අධ්‍යාපන ආයතනවල ශිෂ්‍යයන් සඳහා ක්ෂේත්‍ර පුහුණුව ලබා දුන් සංඛ්‍යාව	100%		
ප්‍රතිපත්ති තීරණ ඉලක්ක කරගත් සාකච්ඡා සඳහා තොරතුරු සහ සහය ලබා දීම	100%		
කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානයෙහි මූල්‍ය හා පරිපාලන කාර්යයන්, වත්කම් කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය	99%		

05 පරිච්ඡේදය

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

2024 දී කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව (DCD) එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීම සඳහා සැළකිය යුතු අවධානයක් යොමු කර ඇත. දෙපාර්තමේන්තු මූලපිරීම් උපායමාර්ගිකව ප්‍රධාන තිරසර සංවර්ධන ඉලක්ක සමඟ සන්ධානගත වූ අතර විශේෂයෙන්;

- ✓ තිරසාර සංවර්ධන ඉලක්ක 1 (සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම),
- ✓ තිරසර සංවර්ධන ඉලක්ක 2 (කුසගින්න අවසන් කිරීම),
- ✓ තිරසර සංවර්ධන ඉලක්ක 8 (සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය),
- ✓ තිරසර සංවර්ධන ඉලක්ක 13 (දේශගුණික ක්‍රියාකාරකම්),
- ✓ තිරසර සංවර්ධන ඉලක්ක 15 (ගොඩබිම මත ජීවය) කෙරෙහි අවධානය යොමු කරන ලදී.

මෙම ප්‍රයත්නයන් කුරුඳු කර්මාන්තයට ධනාත්මක දායකත්වයක් ලබා දුන් අතර, ඵලදායිතාව වැඩි දියුණු කිරීම, ආදායම වැඩි දියුණු කිරීම, තිරසාර භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි ද දායකත්වය සපයා ඇත.

5.1 හඳුනාගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු.

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහන දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
තිරසර සංවර්ධන ඉලක්ක 1: සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	කුරුඳු කර්මාන්තය ආශ්‍රිත පාර්ශවකරුවන්ගේ ජීවනෝපාය ඉහළ නැංවීම සහ තිරසාර කෘෂිකර්මාන්තය උදෙසා වූ සම්පත් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම මගින් දරිද්‍රතාවය අවම කිරීම.	ප්‍රතිලාභීන් 1,135ක් වැඩිදියුණු කරන ලද ගොවිතැන් පිළිවෙත් සහ සම්පත් සඳහා ප්‍රවේශය ලබා ගත්හ. කුරුඳු වගාව ආශ්‍රිත ඵලදායීතා ප්‍රවර්ධනය සඳහා රුපියල් 29,140,250ක මුදලක් ආයෝජනය කරන ලදී.			✓

තිරසර සංවර්ධන ඉලක්ක 2: කුසගින්න අවසන් කිරීම	කුරුඳු කර්මාන්තය තුළ ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම සහ තිරසාර කෘෂිකාර්මික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම.	කුරුඳු පසු අස්වනු ක්‍රියාවලි වල කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය වැඩි දියුණු කිරීම සඳහා නව තාක්ෂණයන් හඳුන්වා දෙන ලදී. දේශීය ගොවීන්ගේ නිෂ්පාදන වලට වටිනාකමක් එකතු කිරීම මගින් වැඩි ආදායමක් ලබා ගැනීමට අවස්ථාවක් ලබා දුන් අතර ඉහත කර්මාන්තය ආශ්‍රිතව නව සෘජු හා වක්‍ර රැකියා අවස්ථා බිහි කරන ලදී.			✓
තිරසර සංවර්ධන ඉලක්ක 8: සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය	රැකියා අවස්ථා නිර්මාණය කිරීම, නිපුණතා වැඩි දියුණු කිරීම සහ කුරුඳු කර්මාන්තය ආශ්‍රිතව ආර්ථික වර්ධනය මෙහෙයවීම.	කුරුඳු නිෂ්පාදනය, සැකසීම සහ අගය එකතු කිරීම පිළිබඳ ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කරමින් පුද්ගලයන් 1,000+ ක් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී විය.වැඩි දියුණු කළ කුරුඳු ගොවිතැන් ක්‍රමවේද සහ කුඩා පරිමාණ සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම තුළින් රැකියා උත්පාදනය ප්‍රවර්ධනය කරන ලදී. ක්‍රමවත් සහතිකකරණය තුළින් කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන කෙරෙහි විදේශීය ගැනුම්කරුවන්ගේ විශ්වාසය වැඩි දියුණු කරන ලදි.			✓
තිරසර සංවර්ධන ඉලක්ක 13: දේශගුණික ක්‍රියාකාරකම්	කුරුඳු වගාවට දේශගුණික විපර්යාස බලපෑම් අවම කිරීම සහ තිරසාර ගොවිතැන් පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.	පුහුණුව සහ තාක්ෂණික සහාය තුළින් තිරසාර ගොවිතැන් පිළිවෙත් ප්‍රවර්ධනය කරන ලදී. කුරුඳු සැකසීමේ කාබන් පියසටහන අඩු කිරීමට බලශක්ති කාර්යක්ෂම තාක්ෂණයන් දායක විය. පාංශු පරීක්ෂණ සේවා ගොවීන්ට සම්පත් ප්‍රශස්ත කිරීමට සහ ඉඩම් හායනය අවම කිරීමට උපකාරී විය.			✓
තිරසර සංවර්ධන ඉලක්ක 15: ගොඩබිම මත ජීවය	කුරුඳු වගාවේ ඉඩම් හා පරිසර පද්ධති තිරසාර ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම.	තාක්ෂණික ප්‍රකාශණය බෙදා හැරීම හා GAP සහතිකකරණය තිරසාර ඉඩම් කළමනාකරණ භාවිතයන් වැඩි දියුණු කළ අතර, පාංශු සංරක්ෂණයට සහ කුරුඳු වගා කරන ප්‍රදේශවල පරිසර පද්ධති ආරක්ෂා කිරීමට දායක විය.			✓

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකවින්.

2024 වසර ශ්‍රී ලංකාවට තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීමේ ගමනේ සැලකිය යුතු ප්‍රගතියක් සනිටුහන් කළේය. විශේෂයෙන්ම, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව (DCD) විසින් දියත් කරන ලද මුල පිරීම්, රටේ සමස්ත SDG සාක්ෂාත් කරගැනීමට විශාල දායකත්වයක් ලබා දුන්නේය.

ප්‍රධාන ජයග්‍රහණ:

• දුගීබව අවම කිරීම (SDG 1): DCD විසින් කුරුඳු පැල මිලියනයකට අධික ප්‍රමාණයක් නිකුත් කරමින් ගොවීන් 1,135 දෙනෙකුගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීමට සහ ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීමට දායක විය. මේ සඳහා රුපියල් මිලියන 29කට අධික මූල්‍ය ආයෝජනයක් සිදු කරන ලදී.

• කුසගින්න අවසන් කිරීම (SDG 2): පශ්චාත් අස්වනු තාක්ෂණ සංවර්ධන වැඩසටහන් සහ නවීන උපකරණ (වියළන යන්ත්‍ර, ඇඹරුම් යන්ත්‍ර) හඳුන්වා දීමෙන් කුරුඳු සැකසීමේ කාර්යක්ෂමතාව ඉහළ නංවා අපද්‍රව්‍ය අවම කෙරිණි. කුඩා පරිමාණ සැකසුම් මධ්‍යස්ථාන තුනක් පිහිටුවීමෙන් ගොවීන්ට අගය එකතු කිරීමට සහ නව රැකියා උත්පාදනයට අවස්ථා ලැබිණි.

• සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය (SDG 8): පුළුල් පරාසයක පුහුණු වැඩසටහන් (ගොවි පුහුණු වැඩසටහන් 106ක්, කාන්තා කුරුඳු තැළුම් පුහුණු වැඩසටහන් 3ක්) හරහා 1,000කට අධික පිරිසකගේ කුසලතා වැඩි දියුණු කරන ලදී. පාංශු පරීක්ෂණ සේවා සහ GAP/GI සහතිකකරණ වැඩසටහන් මගින් කුරුඳු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ ජාත්‍යන්තර විශ්වාසය තහවුරු විය.

• දේශගුණික ක්‍රියාකාරකම් (SDG 13): තිරසාර ගොවිතැන් ක්‍රම (පාංශු සංරක්ෂණය, කාර්යක්ෂම ජල කළමනාකරණය) ප්‍රවර්ධනය කිරීම සහ බලශක්ති කාර්යක්ෂම තාක්ෂණයන් හඳුන්වා දීමෙන් කුරුඳු කර්මාන්තයේ පාරිසරික පියසටහන අඩු කිරීමට පියවර ගෙන ඇත.

• ගොඩබිම මත ජීවය (SDG 15): තිරසාර ඉඩම් කළමනාකරණය, ජෛව විවිධත්ව සංරක්ෂණය සහ GAP සහතිකකරණය හරහා කුරුඳු වගා ප්‍රදේශවල පරිසර පද්ධති ආරක්ෂා කිරීමට දෙපාර්තමේන්තුව දායක විය.

අභියෝග:

2024 වසරේදීද ශ්‍රී ලංකාවට ආර්ථික අස්ථාවරත්වය, ගෝලීය වෙළඳපල උච්චාවචනයන් සහ දේශගුණික විපර්යාසයන්හි බලපෑම් වැනි පොදු අභියෝග රැසකට මුහුණ දීමට සිදු විය. විශේෂයෙන්ම, කෘෂිකාර්මික අංශයට කාලගුණ රටා වෙනස්වීම්වලින් ඇති වූ බලපෑම්, තාක්ෂණික දැනුම සහ මානව සම්පත් නිසි පරිදි ව්‍යාප්ත කිරීමේ අභියෝග සහ ප්‍රමිතිකරණ ක්‍රියාවලීන් තවදුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු විය.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	14	11	03
තෘතීයික	02	01	01
ද්විතීයික	88	52	36
ප්‍රාථමික	39	34	05
එකතුව	**143**	**98**	**45**

6.2 ආයතනයේ ක්‍රියාකාරිත්වයට මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

දැනට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 143ක් වුවද 2024.12.31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 45ක් විය. මේ අතුරින් විශේෂයෙන්ම ද්විතීයික ශ්‍රේණියට අයත් නිලධාරීන්ගේ ඌණතාවය දැඩි ලෙස බලපා තිබේ. ක්ෂේත්‍රයේ ව්‍යාප්ති හා සංවර්ධන කටයුතු සඳහා සෘජුවම පහසුකම් සම්පාදනය කරනු ලබන කුරුඳු සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීමට නොහැකිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. ඊට අදාළ බඳවා ගැනීමේ පටිපාටි සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2024.11.21 දින අමාත්‍යාංශය මඟින් යොමු කර ඇතත් මෙතෙක් අනුමැතිය ලැබී නොමැත.

එසේම, ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් ගණකාධිකාරී තනතුර සඳහා නිත්‍ය නිලධාරියෙක් නොමැති වීම ද අභියෝගයක්ව පවතී. විශේෂයෙන්ම ගණන්දීමේ නිලධාරියෙකුගේ කාර්යභාරය දෙපාර්තමේන්තු ප්‍රධානියාට පැවරී ඇති සංදර්භය තුළ ඊට අදාළ වගකීම් හා වගවීම් කාර්යභාරය ඉටුකළ හැකි නිත්‍ය නිලධාරියෙකු ගණකාධිකාරී තනතුරේ සිටීම අතිශය වැදගත් වේ.

එසේම, ජාතික විගණන පනතේ විධිවිධාන හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කොට පවත්වා ගෙන යා යුතු වුවද, අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වීම හා අවම වශයෙන් වැඩ බැලීම සඳහා හෝ සුදුසු නිලධාරියෙකු නොමැති වීම මත මෙතෙක් අභ්‍යන්තර විගණන අංශයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර නොමැත. ඒ තුළින් යහපාලන මූලධර්ම පිළිපැදීම, අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම හා අවදානම් කළමනාකරණයට අදාළව ගත යුතු පියවර ගැනීම ඉතා දුෂ්කරව පවතී.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය		නිමවුම / ලබා ගත් දැනුම*
			දේශීය (රු.)	විදේශීය (රු.)	දේශීය (රු.)	විදේශීය (රු.)	
කුළුබඩු පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	ඒ.ඒ. විජේවීර මිය	2024.06.05 – 2024.06.07		30,140.00		විදේශීය	ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නංවාලීමට හැකිවීම.
විද්‍යාගාර ප්‍රතිනතය සඳහා අත්‍යාවශ්‍ය වන විද්‍යාගාරයන් අතර සාම්පල පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රවීණතා පරීක්ෂණය	කේ.එච්.ජී.එම්. තරංගා මිය	2024.07.15 - 2024.08.15	15,000.00		දේශීය		
පාංශු හා ශාක පෝෂණ අංශයේ විද්‍යාගාර ප්‍රතිනතය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා වන පුහුණු වැඩසටහන	හිරෝෂා ජයවික්‍රම මිය	2024.12.12 2024.12.19 2024.12.23 2025.01.09 2025.01.16	181,425.00		දේශීය		

2024 වර්ෂයේ මානව සම්පත් සංවර්ධනය සඳහා වෙන් වූ මුළු ප්‍රතිපාදනය රු.500,000.00 කි. එසේම ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 මඟින් කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධනය යම් යම් සීමාවන්ට යටත්ව සිදු කිරීමට උපදෙස් ලබා දී තිබීම මත, තෝරාගත් අත්‍යවශ්‍ය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීමට සිදු විය ඒ මත මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කිරීම අපහසු විය. තව ද වර්ෂය පුරාම නිලධාරීන් වරින් වර ස්ථාන මාරු වී පැමිණීම මත 2024 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුව වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම දුෂ්කර වූ අතර 2025 වර්ෂයේ සිට මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුව ක්‍රියාත්මක වීමට සැලසුම් කර ඇත.

අනුකූලතා වාර්තාව

2023 වර්ෂයේදී කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවට වෙන් වූ රු.මි. 200ක ප්‍රතිපාදන කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත පවරා දෙන ලද බැවින් එම වර්ෂයට අදාළ ගිණුම් කටයුතු එම අමාත්‍යාංශය විසින් සිදු කරන ලදි.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ.		
1.6	වෙනත්	අදාළ නොවේ.		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම. (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		

2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම. (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම.	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම.	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ.		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම.**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතී. එම නිසා වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීමට නොහැකි වී ඇත.	සුදුසු නිලධාරියෙකු පත්කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.
4.4	වාර්ෂික ඇස්තමේතුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.	අමාත්‍යාංශය විසින් සිදු කර ඇත.	

4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
5	**විගණන විමසුම.**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අදාළ නොවේ. විගණන විමසුම් නිකුත්ව නොමැත.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණන තනතුර පුරප්පාඩුව පවතී. අභ්‍යන්තර විගණක අංශයක් ස්ථාපිත කර නොමැත. එම නිසා කටයුතු කිරීමට නොහැකි වී ඇත.	සුදුසු නිලධාරියෙකු පත්කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම .	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතී. අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත. එම නිසා කටයුතු කිරීමට නොහැකි වී ඇත.	සුදුසු නිලධාරියෙකු පත්කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.
6.3	2018 අංක 19 දරණ විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණන තනතුර පුරප්පාඩුව පවතී. අභ්‍යන්තර විගණක අංශයක් ස්ථාපිත කර නොමැත. එම නිසා කටයුතු කිරීමට නොහැකි වී ඇත.	සුදුසු නිලධාරියෙකු පත්කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.

6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණන තනතුර පුරප්පාඩුව පවතී. අභ්‍යන්තර විගණක අංශයක් ස්ථාපිත කර නොමැත. එම නිසා කටයුතු කිරීමට නොහැකි වී ඇත.	සුදුසු නිලධාරියෙකු පත්කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල නොවේ. කමිටු දෙකක් පවත්වා ඇත.	වසරේ මුල් කාර්තු දෙකේ ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති වීම හා දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමේ කටයුතු වලට මූලිකත්වය දීම මත පළමු කාර්තු දෙකෙහි කමිටු පැවැතිවීමට නොහැකි විය.	2025 වර්ෂයේ සිට නියමිත පරිදි කමිටු හතරක් පැවැත්වීමට සැලසුම් කර ඇත.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තාකර තිබීම.	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාළ නොවේ.	දෙපාර්තමේන්තුව 2023 වර්ෂයේ සක්‍රීය වී නොමැති වීම.	
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අදාළ නොවේ.	දෙපාර්තමේන්තුව 2023 වර්ෂයේ සක්‍රීය වී නොමැති වීම.	

8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අදාළ නොවේ.	දෙපාර්තමේන්තුව 2023 වර්ෂයේ සක්‍රීය වී නොමැති වීම.	
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල නොවේ.	වාහන විෂය නිලධාරීන් පුහුණු කර පොත් පත් හා ලේඛන සකස් කර මූලික කටයුතු සිදු කිරීම මත නියමිත දිනට යැවීමට නොහැකි විය.	2025 වර්ෂයේ සිට මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත දිනට යැවීමට කටයුතු යොදා ඇත.
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අදාළ නොවේ ගර්හිත වාහන නොමැත.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අදාළ නොවේ. වාහන අනතුරු සිදුව නොමැත.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ.	වාහන 3ක පමණ සිදු කර ඇත. වාහන විෂය නිලධාරීන් පුහුණු කර පොත් පත් හා ලේඛන සකස් කර මූලික කටයුතු සිදු කිරීම මත නියමිත දිනට සිදු කිරීමට නොහැකි විය.	ඉතිරි වාහන හතර ඉදිරියේදී නියමිත පරිදි ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු යොදා ඇත.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අදාළ නොවේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසැඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අදාළ නොවේ.		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම.	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය/ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අදාළ නොවේ.		
13	**පොදු තැන්පත් ගිණුම.**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අදාළ නොවේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ.		

15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අදාළ නොවේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ.		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාළ නොවේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල නොවේ.	අදාළ පුරප්පාඩු සඳහා නිලධාරීන් පත්කර නොමැති වීම.	කාර්යය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස ඉල්ලීම් කර ඇත.
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
17.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ.	ප්‍රමාණවත් කාලයක් හා නිලධාරීන් නොමැති වීම මත සකස් කළ නොහැකි විය.	2025 වර්ෂයේදී සකස් කිරීමට කටයුතු යොදා ඇත.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ.	ප්‍රමාණවත් කාලයක් හා නිලධාරීන් නොමැති වීම මත සකස් කළ නොහැකි විය.	2025 වර්ෂයේදී සකස් කිරීමට කටයුතු යොදා ඇත.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛ යේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අදාළ නොවේ.	2023.11.30 දිනැති රා.ප.ව.02/2018/(i) මගින් මෙම අවශ්‍යතාවය ඉවත් කර ඇත.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධන කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අදාළ නොවේ.		













DEPARTMENT OF CINNAMON DEVELOPMENT

GUNARATHNA WEERAKOON MAWATHA, BORAKANDA

KARANDENIYA

FAX : +94 912210998 **DIRECTOR GENERAL: +94 912210997**